**පුවත්පත**
**නිවසටම ගෙන්වා ගැනීමට**
**දැන්ම අමතන්න : 0761 367 623**
නැතිනම් මෙම කේතය ස්කෑන් කර තොරතුරු ලබා දෙන්න



# අරුණ

2023 ජුලි 4 අඟහරුවාදා | හතර වැනි කාණ්ඩය | 236 කලාපය | මිල රු 60.00 | www.aruna.lk


# වෘත්තීය සමිති නායකයින් වත්කම් ප්‍රකාශ දීම මග හැරලා

අශිකා ජයවීර

ලබාදී තිබූ කාල සීමාව ඇතුළත කිසිදු වෘත්තීය සමිති නායකයකු හෝ නිලධාරියකු වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දී නොමැති බව කම්කරු අමාත්‍යාංශය පවසයි.

02 පිටුවට

## අඟහරු ලෝකේ පස් යුදගනාවේ



සාලිය කුමාර ගුණසේකර/ ප්‍රගීත් ජනක - කොලොන්න

අඟහරු ග්‍රහයාගේ තිබෙන සර්පෙන්ටීන් " Serpentin" නමැති පාෂාණයට සමානතාවක් දක්වන පාෂාණ ගිනිගල්පැලැස්ස, ඉඳිකොළපැලැස්ස, උස්සන්ගොඩ සහ යුධගනාව ආශ්‍රිත ප්‍රදේශවල විහිදී තිබෙන බවට ලැබී තිබෙන තොරතුරු අනුව නාසා ආයතනයේ විද්‍යාඥයන් පර්යේෂණ කණ්ඩායමක් පර්යේෂණ ආරම්භ කර ඇත.

02 පිටුවට

## ලිට්‍රෝ තවත් බස්සන්න යයි

චාමර පල්ලේගෙදර

කිලෝ ග්‍රෑම් දෙළහයි දශම පහේ ලිට්‍රෝ ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 200කින් පමණ අඩු කිරීමට බලාපොරොත්තු වන බව ලිට්‍රෝ සමාගමේ සභාපති මුදිත පීරිස් පැවසීය.

02 පිටුවට




## පරාටා කා පුටු උඩින් යැවූ සමන් සාමදාන වෙයි
## 1650ට 25,000ක් ගෙවයි

බණ්ඩාරගම - බිමල් ජයසිංහ
දර්ශන් කානිල් - මොරටුව



පානදුර පාලම අසල ආපන ශාලාවක සේවකයන් දෙදෙනකුට පහර දී දේපළවලටද අලාභානි කළ ජනප්‍රිය ගායක සමන් ද සිල්වා එහි හිමිකරු වෙත රුපියල් විසිපන්දහසක් ලබා දී සිද්ධිය සමථයකට පත්කරගෙන තිබේ.

02 පිටුවට

## හොර මූල්‍ය ආයතනයකට රැවටුණු ක්‍රීඩා ගුරුවරයා දිවි නසා ගනී



නුවන් ජයසේකර - මීගහජඳුර

මූල්‍ය ගනුදෙනුවක් සම්බන්ධයෙන් වූ සිත් තැවුලක් හේතුවෙන් වලස්මුල්ල පල්ලෙකන්ද උතුරු කණුමුල්දෙණිය විද්‍යාලයේ ක්‍රීඩා පුහුණු උපදේශකවරයා විද්‍යාලයේ සිය නිල කාමරය තුළදී ගෙලවැලලාගෙන මියගොස් ඇතැයි වලස්මුල්ල පොලිසිය පවසයි.

02 පිටුවට






## සෙල්ෆියක් නිසා තරුණියක් ඔයේ යයි



05 පිටුවට

## හරෝ හරා කියමින් කතරගම නිලමෙට හූ කියලා

එෆ්. අස්ලම්

රුහුණු මහා කතරගම දේවාලයේ වාර්ෂික ඇසළ මංගල්‍යයට සමගාමීව ගිනි පෑගීම සිදුකරන ස්ථානය සම්බන්ධයෙන් දේවාලයේ කපුමහතා හා බැතිමතුන් බස්නායක නිලමේවරයා සමගින් ඇතිකරගත් ගැටුමක් නිසා පසුගිය 30 වැනිද රාත්‍රියේ දේවාල පරිශ්‍රයේ උණුසුම් තත්ත්වයක් ඇතිවිය. ගිනි පෑගීම සඳහා සූදානමින් සිටි බැතිමතුන් හරෝ හරා කියන අතරේ බස්නායක නිලමේ ඩිෂාන් ගුණසේකරට හූ කීම නිසා ඔහු එම ස්ථානයෙන් ඉවත් විය.

02 පිටුවට



උණුසුම් කතා බහක් ඇති වූ අවස්ථාව










## තැන තැන කියවමින් ඉන්න එපා
## විපක්ෂ නායකකමත් රැක දෙන්නම්: පස්සෙ ජනපති වෙන්න:
### ජනපති සජිත්ට කියයි

නුවන් ජයසේකර - මීගහජඳුර

සජිත් ප්‍රේමදාස ඇතුළු විපක්ෂයෙන් මම එක ඉල්ලීමක් කරනවා. දැන් හරි කමක් නෑ එන්න. අපි සමග එකතු වෙන්න මේ රට ගොඩ නගන්න. මේ ජනතාව මුදාගන්න රට ගොඩ නගන්න විපක්ෂයේ හැමෝම අපිත් එක්ක එකතු වෙන්න.

02 පිටුවට




පාසලේ තොරතුරු සහ ඔබගේ නිර්මාණවලට 'අපේ පිටුවේ' ඉඩ තිබේ.

අපේ පිටුව, දිනපතා අරුණ, අංක 91, විජේරාම මාවත, කොළඹ 7
aruna.editor@liberty.lk


ද්විතියික අංශයේ ආචාර්ය මණ්ඩලය

# වෙන්නප්පුව සාන්ත ජෝශප් වාස් විද්‍යාලය

කතෝලික සභාවේ මාරිස්ට් නිකායේ සහෝදරවරුන්ගේ මූලිකත්වයෙන් 1934 වර්ෂයේදී වෙන්නප්පුව සාන්ත ජෝශප් විද්‍යාලය බිහි විය. සිසුන් විසිනව දෙනකුගෙන් ආරම්භ වූ පාසලේ මුල්ම විදුහල්පති වූයේ ගරු ලුවිස් සහෝදරතුමන්ය. එදා සිට අද දක්වා විදුහල්පතිවරුන් පහළොස් දෙනකුගේ පරිපාලනය යටතේ පැවැති විද්‍යාලයේ වත්මන් විදුහල්පතිධුරය දරන්නේ ගරු පී.ඩී.ප්‍රියංජීව ගුණරත්න පියතුමන්ය.

"දෙවිඳුන්ට හා මිනිසාට එක ලෙස සේවය කරන්න" යන්න පාඨය ආදර්ශ කොටගත් මෙම විද්‍යාලය ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමන් වෙනුවෙන් කැපකර ඇති මෙරට පිහිටි එකම පාසලයි.


විදුහල්පති - ගරු පී.ඩී.ප්‍රියංජීව පියතුමා

1962 රජයට පවරා ගත් පාසල අද වන විට සිසුන් තුන්දහස් හයසිය හැත්තෑවකින් හා කාර්ය මණ්ඩලය එකසිය හැටඅට දෙනකුගෙන් සපිරී ඇත. පළමු ශ්‍රේණියේ සිට දහතුන්වැනි ශ්‍රේණිය දක්වා අධ්‍යාපන කටයුතු සිදුකරන අතර උසස් පෙළ කලා, වාණිජ (සිංහල/ඉංග්‍රීසි ) ගණිත (සිංහල/ ඉංග්‍රීසි) ජීව විද්‍යා (සිංහල /ඉංග්‍රීසි) මාධ්‍ය පන්තිවලින්ද සමන්විතය. ශිෂ්‍යත්ව මෙන්ම සාමාන්‍ය පෙළ හා උසස්පෙළ විභාගයන්ගේ ප්‍රතිඵලද සෑම වසරකදීම ඉහළ අගයන් පෙන්වීම විශේෂත්වයකි. මේ නිසාම ජෝශප් වාස් විද්‍යාලයට තම දරුවා ඇතුළත් කර ගැනීමට මවුපියන් අතර ඇත්තේ ඉමහත් තරගයකි.

සාන්ත ජෝශප් වාස්විද්‍යාලය ඔලිම්පික්වෙනුවෙන් මලල ක්‍රීඩකයන් හය දෙනකු බිහිකළ මෙරට පිහිටි එකම පාසල ද වන්නේය. 1980 වර්ෂයේදී ඔලිම්පික් තරග සඳහා සහභාගී වූ නිව්ටන් පෙරේරා මෙන්ම 2000 වර්ෂයේදී සිඩ්නි ඔලිම්පික් උළෙල වෙනුවෙන් මෙරට නියෝජනය කළ රොහාන් ප්‍රදීප් කුමාර, මනුර ලංකා පෙරේරා, සුමේධ අරුණ ශාන්ත, වී. රත්න කුමාර යන හතරදෙනාම බිහිවූයේ ජෝශප් වාස් විද්‍යාලයෙනි. දකුණු ආසියාවේ වේගවත්ම ධාවකයා වන යුපුන් අබේකෝන්ද ජෝශප් වාස් ආදි සිසුවකි. ක්‍රිකට්, බැට්මින්ටන්, නෙට්බෝල්, වොලිබෝල් ඇතුළු ක්‍රීඩා අංග දහතුනක් පමණ ක්‍රියාත්මක වන අතර සෑම වසරකම ජාත්‍යන්තර ක්‍රීඩා තරග වෙනුවෙන් විද්‍යාලයෙන් පහළොස් දෙනකුවත් සහභාගී වීමද විශේෂය.

බාහිර ක්‍රියාකාරකම් වශයෙන් රතු කුරුස, පරිසර නියමු, ශිෂ්‍යභට, බාලදක්ෂ, මාධ්‍ය සංගමය ඇතුළු සංගම් රැසක් ක්‍රියාත්මක වේ. විදේශීය ආදි ශිෂ්‍ය සංගම්ද ඇතුළුව ජෝශප් වාස් විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගම් හතක් ඇත. ලන්ඩන්, මෙල්බර්න්, නවසීලන්ත, ඉතාලියේ වෙරොනා, නාපෝලි හා මිලානෝ නගර තුනෙහි ආදි සිසු සංගම් තුනක්ද වශයෙනි.

එමෙන්ම විශේෂිත තාක්ෂණික ක්‍රමෝපායන් උපයෝගී කරගෙන ඉදිකෙරෙන, දැවැන්ත වේදිකාවක් සහිත එක්වර භාරදහසකට ආසන පහසුකම් සහිත ජාතික වශයෙන් පවා වැදගත්කමක් ඇති ගෘහස්ථ ක්‍රීඩාංගණය 2025 දී විවෘත කිරීම සාන්ත ජෝශප් වාස් විද්‍යාලයේ සැබෑවන සිහිනයකි. එමෙන්ම වාස් ඉතිහාසයේ පළමුවැනි වරට "නැවත පාසල කරා (Back to School)" වැඩසටහන එළැඹෙන ජූලි 8 වැනිද සාන්ත ජෝසප් වාස් විද්‍යාලයේ පැවැත්වෙන්නේ පාසලේ අභිවෘද්ධිය වෙනුවෙන් කැප වී සිටින ආදි ශිෂ්‍ය සංගමයෙන් දියත් කළ තවත් එක් සාර්ථක වැඩසටහනක් ලෙසය.



**ජෝශප් වාස් විද්‍යාලයේ වත්මන් විදුහල්පති ගරු පී.ඩී.ප්‍රියංජීව ගුණරත්න පියතුමන්ගේ පණිවුඩය.**

" අපේ පාසල සුවිශේෂ වීමට එක් හේතුවක් තමයි ජුසේවාස් මුනිතුමන්ගේ ආශිර්වාදය මේ බිමට පා තැබූ ඕනෑම කෙනකුට හිමිවීම. මමත් මේ පාසලේම ආදි ශිෂ්‍යයෙක්. කතෝලික සංස්කෘතියට අනුව ගොඩනැගුණු උප සංස්කෘතීන් අපේ පාසලේ ගොඩනැගී තියෙනවා. විනය අතින් ගත්තත් එය විශේෂයි. ආගමික ආශිර්වාදය සමගයි පාසලක් හැටියට අපි දිනෙන් දින වර්ධනය වෙන්නේ. ආදි ශිෂ්‍ය සංගමයේ විධායක සභාපති ඇතුළු විධායක කමිටුවට මම ස්තුතිවන්ත වෙනවා මෙවැනි වැඩසටහනක් සංවිධානය කිරීම ගැන. ආදි විදුහල්පතිවරු, ආදි ගුරුවරුන් හා ආදි ශිෂ්‍යයන් නැවත පාසලට පැමිණීම අපට ලොකු ගෞරවයක් ''

**ආදි ශිෂ්‍ය සංගමයේ විධායක සභාපති වන ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශන සේවා සමාගමේ කළමනාකරණ අධ්‍යක්ෂ සුරාජ් කතුරුසිංහගේ පණිවුඩය.**

"ආදි ශිෂ්‍ය සංගමයේ විධායක සභාපතිවරයා ලෙස පත්වීම මගේ ජීවිතයේදී හිමිවූ ස්වර්ණමය අවස්ථාවක්. 2022 වර්ෂයේදී ආදි ශිෂ්‍යයන් එකතු කරගෙන පැවැත්වූ ක්‍රිකට් තරගයෙන් රුපියල් මිලියනයක් පාසලට දෙන්න අපට හැකිවුණා. මේ වන විට මිලියන දහයක තැන්පතුවක් පාසල වෙනුවෙන් වෙන් කර තියෙනවා. ඒ වගේම "බැක් ටු ස්කූල්" වැඩසටහන වෙනුවෙන් අප පාසලේ විශ්‍රාම ගිය ගුරුවරුන්, දැනට වෙනත් පාසල්වල සේවය කරන ගුරුවරුන් හා වර්තමානයේ අපේ පාසලේ සේවය කරන ගුරුවන්ටත් ආදි සිසුන්ටත් අපි ආරාධනා කළා. විශ්‍රාමික ගුරුවරුන් වෙනුවෙන් විශේෂිත උපහාර පිළිගැන්වීමක් එදින කරනවා. හිටපු සභාපතිතුමා වන හිලරි ලිවේරා හා වත්මන් ප්‍රධාන ලේකම් අසේල පෙරේරා, භාණ්ඩාගාරික මයුරාජ් බලපිටිය ඇතුළු විධායක කමිටුවේ සියලුම මහත්වරු හා විදෙස් ආදි ශිෂ්‍ය සංගම් මේ වෙනුවෙන් මට උපකාර කළා. ජෝශප් වාස් විද්‍යාලයේ ආදි ශිෂ්‍යයන්ට 8 වැනිද අපි සමග එකතු වෙන්නැයි පාසල වෙනුවෙන් මම ආරාධනා කරනවා."

▼ අනීෂා මානගේ


ආදි ශිෂ්‍ය සංගමයේ සභාපති සුරාජ් කතුරුසිංහ


බැඩ්මින්ටන් කණ්ඩායම


ආදි ශිෂ්‍ය සංගමයේ විධායක කමිටුව


වොලිබෝල් කණ්ඩායම


මාධ්‍ය ඒකකය


විද්‍යා සංගමය


සෞන්දර්ය ඒකකය


ප්‍රාථමික අංශයේ ආචාර්ය මණ්ඩලය


ශිෂ්‍ය නායක මණ්ඩලය



01 වැනි පිටුවෙන්...

## වෘත්තීය සමිති නායකයින්...

කම්කරු අමාත්‍යාංශ ලේකම් ආර්.පී.ඒ.විමලවීර පැවසුවේ 2,000ක් පමණ වන එම නියෝජිතයන් කිසිවකු හෝ මෙතෙක් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොමැති බවය.

වත්කම් බැරකම් පනතට අනුව රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවල වෘත්තීය සමිති නායකයන් ඇතුළු නිලධාරීන් සිය වත්කම් බැරකම් ප්‍රකාශ, කම්කරු අමාත්‍යාංශ ලේකම්වරයා වෙත යොමු කළ යුතු වේ.

නමුත් ඒ සම්බන්ධයෙන් තමා විසින් අදාළ පාර්ශ්ව වෙත දැනුම් දී දුන්න ද මෙතෙක් ප්‍රතිචාර ලැබී නොමැති බව අමාත්‍යාංශ ලේකම්වරයා කියා සිටියේය.

කෙසේවෙතත් අදාළ පනතට අනුව මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාවක් තමාට නොමැති බව ද අමාත්‍යාංශ ලේකම්වරයා වැඩිදුරටත් පැවසුවේය.

## අඟහරු ලෝකේ පස්...

මෙම පර්යේෂණ කණ්ඩායමේ ප්‍රධානියා ලෙස කටයුතු කරනු ලබන්නේ ශ්‍රී ලාංකිකයකු වන ඇමරිකාවේ ලුසියානා ප්‍රාන්ත විශ්වවිද්‍යාලයේ මහාචාර්ය සුනිති කරුණාතිලකය. ඔහු නාසා ආයතනයේ ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයකු ලෙසද කටයුතු කරන්නේය.

“ලංකාවේ භූගෝල ලක්ෂණ අනුව පෙනී ගොස් තිබෙනවා අඟහරු ග්‍රහයාගේ තිබෙන පස් හා පාෂාණ වර්ගවලට සමරූපිතා දැක්වීම. උදහරණයක් ලෙස සර්පන්ටීන් කියන Serpentin පාෂාණය හඳුන්වාදිය හැකියි.’’ යැයි ආචාර්ය සුනිති කරුණාතිලක කියන්නේය.

පර්යේෂණ කණ්ඩායම විසින් ගිනිගල්පැලැස්ස විහාරස්ථානය පිටුපස පිහිටා තිබෙන වනාන්තර ප්‍රදේශය ආශ්‍රිතව අධි සංවේදී උපකරණ භාවිතකරමින් පරීක්ෂණ ආරම්භ කර ඇති අතර, නියැදි ලබා ගැනීමද සිදු කරනු ලබන්නේය.

මෙම පර්යේෂණයට එක්ව සිටින පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූ විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය ප්‍රසන්න ලක්ෂිත ධර්මප්‍රිය කියා සිටියේ ගිනිගල්පැලැස්ස ප්‍රදේශයේ තිබෙන පාෂාණ වර්ගයට සමාන පාෂාණයක් සහ ඒවා ජීර්ණය වීමෙන් පවතින පස අඟහරු ලෝකයේ තිබෙන බව පර්යේෂකයන් අනාවරණය කරගෙන ඇති බවය.

ඉකුත් 2000 වසරේ සිට නාසා ආයතනය කරන ලද දුරස්ථ පරීක්ෂණවලින් අනාවරණය කරගෙන ඇත්තේ ගිනිගල්පැලැස්සේ පාෂාණවලට අඟහරුගේ ඇති ඇති පාෂාණ සමාන බව යැයිද ආචාර්යවරයා කියයි.

## පරාටා කා පුටු උඩින් යැවූ...

සමන් ද සිල්වා ඇතුළු පස් දෙනකුගෙන් යුත් පිරිසක් පසුගිය පළමු වැනිද රාත්‍රී 11.20ට පමණ එම ආපන ශාලාවට පැමිණ පරාටා සහ කොත්තු ආහාරයට ගැනීමෙන් අනතුරුව එහි බිල නොගෙවා පිටව යාමට සැරසීමත් සමග එහි සේවකයන් විරුද්ධ වී තිබූ බව පානදුර දකුණ පොලිසිය කියයි.

ඔවුන් ආහාරයට ගත් කෑම සඳහා රුපියල් 1650 බිල ගෙවන ලෙස දැනුම් දී ඇති අතර සමන් ද සිල්වා ඇතුළු පිරිසක් ආපනශාලාවේ ඉදිරිපිටට ගොස් නැවත පැමිණ ආපන ශාලාවේ හිමිකරු සහ සේවකයන් සමග බහින්බස් වී සේවකයන්ට පහර දී දේපළවලටද අලාභ හානි සිදුකර ඇත.

එම පහර දීමෙන් සේවකයන් දෙදෙනකු සුළු තුවාල සිදු වී ඇති අතර ප්ලාස්ටික් පුටු හතරකට සහ විශාල ප්‍රමාණයේ වතුර බෝතල් 12කට අලාභ හානි සිදු වී ඇතැයි ආපන ශාලාවේ හිමිකරු පැවසිය.

සිද්ධියට මුහුණ පෑ මුදල් අයකැමිවරයා සහ වේටර්වරයා ඒ සම්බන්ධයෙන් පානදුර දකුණු පොලිසියට පැමිණිල්ලක් කර තිබිණි.

එම පැමිණිල්ලට අදළව පානදුර දකුණ පොලිසිය වෙත පැමිණි සමන් ද සිල්වා අගතියට පත් පාර්ශ්වට සිය කනගාටුව පළ කර අදළ මුදල ලබා දීමට පියවර ගත් බව පොලිසිය කියයි.

## හොර මූල්‍ය ආයතනයකට...

මෙලෙස ගෙලවැලලාගෙන සියදිවි නසාගෙන ඇත්තේ වයස අවුරුදු 38ක වන වලස්මුල්ල පල්ලෙකන්ද උතුරු කණුමුල්දෙණිය විද්‍යාලයේ ක්‍රීඩා පුහුණු උපදේශකවරයා ලෙස කටයුතු කළ මොදරවාන, ඕකෙවෙල ලිපිනයේ පදිංචි ශ්‍රීනාත් දර්ශන නමැති අයයි.

ගුරුවරයා පාසලේ ක්‍රීඩා කාමරය තුළ තිබූ බාල්කයක එල්ලී මියගොස් සිටියදී විදුහල්පතිවරයා විසින් ඒ පිළිබඳව වලස්මුල්ල පොලිසියට දැනුම් දී තිබේ. ඒ අනුව සිද්ධිය සම්බන්ධයෙන් වලස්මුල්ල පොලිසිය පරීක්ෂණ ආරම්භ කර ඇත. ගුරුවරයා ලිපියක්ද ලියා තබා මෙලෙස සියදිවි නසාගෙන තිබේ. මූලික පරීක්ෂණවලදී අනාවරණය වී ඇත්තේ අදළ ගුරුවරයා නීති විරෝධී මූල්‍ය ආයතනයක මුදල් ආයෝජනය කර ඇති අතර පසුව එය නොලැබී යාම නිසා ඇති වූ සිත් තැවුලක් හේතුවෙන් මෙලෙස සියදිවි නසාගෙන ඇති බවයි. කෙසේ වෙතත් සිද්ධිය සම්බන්ධයෙන් තංගල්ල කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කේ.බී. කීර්තිරත්න උපදෙස් පරිදි වලස්මුල්ල පොලිසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.


ඉරිදා 2023.07.02 www.nlb.lk
National Lotteries Board

මහජන සම්පත — දිනුම් වාරය : 5163 — රු. 13,141,096.00
ජයග්‍රාහී අක්ෂරය C — ජයග්‍රාහී අංක 5 2 2 6 4 4

ගොවිසෙත — 3405 — රු. 67,256,334.80
R 07 11 57 76

ජාතික සම්පත — දිනුම් වාරය 1618 — රු. 13,149,734.32
ජයග්‍රාහී අංක 7 7 8 5 6 3

ධන නිධානය — රු. 97,722,600.40
H 21 51 55 72

හඳහන — දිනුම් වාරය 472 — රු. 2,548,404.80
ජයග්‍රාහී අංක 06 16 26 47

Mega POWER — 1511 — Rs. 333,814,798.00
D 21 01 23 37 46
රු. 10,000,000.00
රු. 10,000,000.00


# වරාය ලොක්කකුගේ ගෙදරට පැන කෝටි එකහමාරක බඩු උස්සලා

## වහලය හදපු බාස්ගෙ ප්ලෑනක්

බිමල් ජයසිංහ - බණ්ඩාරගම

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මානව සම්පත් කළමනාකරුගේ බොරලැස්ගමුව කටුවාවල පිහිටි නිවසට උල් පිහියක් රැගෙන ඇතුළු වී මෙහෙකාරිය බියගන්වා රුපියල් කෝටි එකහමාරක පමණ වටිනාකමකට ආසන්න රන් භාණ්ඩ සහ මුදල් කොල්ලකෑම සම්බන්ධයෙන් පුද්ගලයන් තිදෙනකු බොරලැස්ගමුව පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

මෙලෙස අත්අඩංගුවට ගත් සැකකරුවන් අතර වරාය අධිකාරියේ මානව සම්පත් කළමනාකරුගේ නිවසේ වහලය සවි කිරීමට පැමිණි පුද්ගලයාද සිටින බව පොලිසිය සඳහන් කරයි.

පසුගිය ජූනි 12වැනිද මෙම කොල්ලකෑම සිදුව ඇත. මානව සම්පත් කළමනාකාරවරයාගේ මෙහෙකාරියගේ සැමියා සහ දරුවා කොල්ලකෑම සිදුවූ දිනට දින කිහිපයකට පෙර මෙම නිවසට පැමිණ ඇති අතර පසුගිය 12 වැනිද මෙහෙකාරිය ඔවුන්ව හැරලවීමට මහරගමට ගොස් ආපසු නිවසට පැමිණි අවස්ථාවේදි නාඳුනන පුද්ගලයකු පැමිණ මරණ තර්ජනය කර ඇගේ දෑත් රෙදි පටියකින් බැඳ තිබේ.

පසුව නිවෙසේ මුදල් හා රන් ආභරණ ඇති තැන් පෙන්වන්නැයි කියමින් ඇයව බිය වද්ද මානව සම්පත් කළමනාකාරවරයාගේ කාමරයට ගොස් අල්මාරිය හැර මුදල් හා රන් ආභරණ කොල්ල කා පලාගොස් තිබිණි.

මේ පිළිබඳ විමර්ශන බොරලැස්ගමුව පොලිසිය විසින් කළ අතර මේ අනුව කොල්ලකෑමට සම්බන්ධ සැකකරුවන් හඳුනාගෙන ඔවුන්ව අත්අඩංගුවට ගෙන තිබිණි.

මෙම කොල්ලකෑම සැලසුම් කර ඇත්තේ මානව සම්පත් අධ්‍යක්ෂවරයාගේ නිවසේ වහලය පිළිසකර කිරීම සඳහා අවස්ථා කීපයකදී පැමිණි පුද්ගලයකු බවත් ඔහු උලපනේ ප්‍රදේශයේ විවිධ අපරාධවලට සම්බන්ධ පුද්ගලයකු යොදවා කොල්ලය සිදුකර තිබූ බවත් ඔහු අත්අඩංගුවට ගෙන කළ ප්‍රශ්න කිරීම්වලින් කොල්ලයේ සුලමුල අනාවරණය වූ බවත් බොරලැස්ගමුව පොලිසිය සඳහන් කරයි.

සැකකරුවන්ගෙන් කරන ලද වැඩිදුර ප්‍රශ්න කිරීම්වලදී එම නිවසෙන් සොරාගත් තිබූ රුපියල් ලක්ෂ තිස්පහක මුදලක්, ඇමරිකානු ඩොලර් දසදහස් නවසිය පනහක්, සහ රුපියල් ලක්ෂ හතළිහක පමණ වටිනාකමක් ඇති රන් ආභරණද සොයාගෙන ඇත.

එමෙන්ම සැකකරුවන් සන්තකයේ තිබී ජීව අත්බෝම්බයක් සහ හෙරොයින් ග්‍රෑම් 24 ක් ද පොලිසිය විසින් සොයාගෙන ඇත.

සැකකරුවන් තිදෙනාම විවිධ අපරාධවලට සම්බන්ධ වූවන් බවත් විවිධ අධිකරණවල නඩු විභාග වෙමින් පවතින පුද්ගලයන් බවත් පොලිසිය කියයි. සැකකරුවන් නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

## දිනපොත

### ආඩි හතයි කැඳ හැළියයි 7 වැනිදා බණ්ඩාරවෙලදී

"ජනක් ප්‍රේමලාල්ගේ" නිර්මාණය වන "ආඩි හතයි කැඳ හැළියයි" නාට්‍ය නිර්මාණය ජූලි 7 වැනිද බණ්ඩාරවෙල පුරහලේදී ප.ව 2.30 හා ප.ව 6.30ට වේදිකා ගතවේ. පළාත් යාන්ත්‍රික දෙපාර්තමේන්තුවේ සුබ සාධක සංගමය මගින් සංවිධානය කරනු ලබයි.

### ජනතාපුර චෛත්‍යයේ නිධන් තැන්පත් කිරීම අද

ජනතාපුර ශ්‍රී බෝධිරාජාරාම විහාරස්ථානයේ අභිනවයෙන් ඉදිකර චෛත්‍යයේ නිධන් වස්තු තැන්පත් කිරීම අද (4 වැනිද) පෙ.ව 9.34 ට යෙදෙන සුබ මොහොතින් සිදුකෙරේ.

01 වැනි පිටුවෙන්...

## ලිට්‍රෝ තවත්...

ඒ අනුව දැනට රුපියල් 3186ක්ව පවතින කිලෝ ග්‍රෑම් දෙළහයි දශම පහේ ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 2900 සීමාවට ගෙන ඒමට හැකි වන බවද සභාපතිවරයා සඳහන් කළේය.

මෙම අඩු වීම සම්බන්ධයෙන් නිශ්චිතවම අද (04 වැනිද) දින ප්‍රකාශයට පත් කරන බවත් එලෙස සංශෝධනය වන මිල හෙට (05) සිට ක්‍රියාත්මනක වන බවත් හෙතෙම කීවේය. එමෙන්ම ලිට්‍රෝ ගෑස් මිල ගණන් අඩු වුවද ලාෆ් ගෑස් සඳහා කිසිදු මිල සංශෝධනයක් සිදු කිරීමට මෙතෙක් තීරණය කර නොමැති බව ලාෆ් සමාගමේ ප්‍රකාශකයෙකු සඳහන් කළේය. කෙසේ වෙතත් මේ වන විට කිලෝ ග්‍රෑම් දෙළහයි දශම පහේ ලාෆ් ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක මිල සඳහන් වන්නේ රුපියල් 3990ක් ලෙසය.

ඊට අමතරව එහි කිලෝ ග්‍රෑම් 5 ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 1596ක් වේ.

## අධි ඇසළ පුන් පොහෝ දා ගංගාරාමයේදී



අධි ඇසළ පුන් පොහොය නිමිත්තෙන් කොළඹ, හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයට පැමිණි මෙරට බෞද්ධ ජනතාව හා විදේශිකයන් ආගමික වතාවත්වල නිරත වූ අයුරු.

ඡායාරූප-සමන් අබේසිරිවර්ධන

## තැන තැන කියවමින් ඉන්න එපා...

එහෙම එකතු වෙලා පස්සේ ජනාධිපති වෙන්න යන්න. අපිත් උදව් කරන්නම්. ඒ නිසා මං කියන්නේ කරුණාකරලා විපක්ෂයේ අයත් එන්න අපි සමග එකතු වෙලා මේ රට ගොඩනගන කටයුත්ත සිදුකරන්න. එතුමාගේ විපක්ෂ නායක පුටුවට මොකුත් වෙන්න දෙන්නේ නෑ. අපි ඒකත් ආරක්ෂා කරලා දෙන්නම්. සභානායකවරයත් ඉන්නවා. ඒ නිසා කෑ කෝ නොගහා තැන තැන කියව කියවා ඉන්නේ නැතිව එන්න අපි හා එකතු වෙලා මේ රට ගොඩ නගන්න සහාය වෙන්න කියා මං විපක්ෂ නායකවරයා ඇතුළු විපක්ෂයෙනුත් ඉල්ලනවා යැයි ජනාධිපති රනිල් වික්‍රමසිංහ පැවසීය.

ජනාධිපතිවරයා ඊයේ (03 වැනිදා) මේ බව පැවසුවේ කෘෂිකර්ම අමාත්‍ය මහින්ද අමරවීරගේ දේශපාලන දිවියට වසර 32ක් පිරීම නිමිත්තෙන් හම්බන්තොට මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති උත්සවයක් අමතමිණි. එහිදී වැඩිදුරටත් අදහස් දැක් වූ ජනාධිපතිවරයා වැඩිදුරටත් මෙසේද පැවැසීය.

පසුගිය කාලය තුළදී රට තුළ උද්ගත වූ තත්ත්වයත් සමගින් මම රටේ ජනාධිපතිවරයා බවට පත් වෙද්දී දිනේෂ් ගුණවර්ධන අගමැති ලෙස පත් වුණා. පසුව අපි නව කැබිනට් මණ්ඩලයක් පත් කරගෙන මේ රට ගොඩනැගීමේ ක්‍රියාවලිය ආරම්භ කළා. එහිදි මහින්ද අමරවීරට ලැබුණේ කෘෂිකර්ම ඇමැතිකම. රටේ කෘෂිකර්මයක් නැති කාලෙක තමයි ඔහුට ඇමැතිකම භාරගන්න වුණේ. අපි ආණ්ඩුව පටන්ගත්ත මුල් කාලෙම තිබුණේ ඉන්ධන ලබාගන්න හා කෘෂිකර්මය නගා සිටුවන්න. මේ කාර්යයේදී මම පක්ෂ විපක්ෂ හැමෝටම ආරාධනා කළා රට ගොඩනගන්න එන්න කියලා. මං හැමෝටම එද කිව්වේ දේශපාලනය පැත්තකින් තියලා අපි හැමෝම රට ගොඩනගන්න එකතු වෙමු කියලයි.

නමුත් විපක්ෂයේ අය එකතු වුණේ නෑ. අදත් මං විපක්ෂ නායකවරයා ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ආරාධනා කරනවා එන්න අපි සමග එකතු වෙන්න කියලා මේ රට ගොඩනගන්න. මේ ගමනට සහයෝගය දුන්නම විපක්ෂ නායකටත් පුළුවන් එතුමා බලාපොරොත්තු වෙන විදියට ජනාධිපති පුටුවට එන්න. අපිත් ඒකට උදව් කරන්නම්. අපි කියන්නේ මේ වෙලාවේ අපි හැමෝම එකතු වෙලා තමයි මේ රට වැටිච්ච තැනින් ගොඩගන්න ඕනි.

මේ අවස්ථාව සඳහා කථානායක ලක්ෂ්මන් යාපා අබේවර්ධන, විජේදස රාජපක්ෂ, ජගත් පුෂ්පකුමාර, ඩබ්ලිව්.ජේ. සෙනෙවිරත්න, නිමල් සිරිපාල ද සිල්වා ඇතුළු මැති ඇමැතිවරුන් රැසක් එක්ව සිටියහ.

## හරෝ හරා කියමින්...

රුහුණු මහා කතරගම දේවාලයේ වාර්ෂික ගිනිපෑගීමේ උළෙල අතීතයේ සිට පැවැත්වූයේ ශ්‍රී අභිනවාරාම විහාරස්ථානය ඉදිරිපිට ඇති මහ වීදියේය. එහෙත් පසුගිය වසරේදී එය වල්ලිඅම්මා දේවාලය ආසන්නයේ ස්ථානයක පැවැත්වීමට පියවර ගෙන තිබිණි.

ඒ අභිනවාරාම විහරස්ථානයට අයත් අලුතින් ඉදිකරන ලද දුටුගැමුණු සෑය පවතින බැවින් එම ස්ථානය අසල ගිනිමැල ගැසීමෙන් චෛත්‍යයට ගිනි රස්නය නිසා හානි විය හැකි බැවින්, එම ස්ථානය වෙනස් කරන ලෙස අභිනවාරාම විහාරාධිපති ශාස්ත්‍රපති කපුගම සරණතිස්ස හිමියන් කළ ඉල්ලීමක් මත බස්නායක නිලමේවරයා ගිනි පෑගීමේ ස්ථානය වෙනස් කර තිබේ.

කෙසේ වෙතත් ගිනි පෑගීම අතීතයේ සිටම කළ මහ වීදියේම කරන ලෙසට දේවාලයේ පෙරහර බරණරාල වන ප්‍රධාන කපු මහතා වන සේපාල රත්නායක උපදෙස් දී තිබේ.

මෙම අවස්ථාවේ කතරගම අභිනවාරාමාධිපති කපුගම සරණතිස්ස හිමි සමග පැමිණි බස්නායක නිලමේ ඩිෂාන් ගුණසේකර සහ කපුමහතා අතර බහින් බස්වීමක් සිදුවූ අතර බස්නායක නිලමේවරයා පවසා සිටියේ දේවාලයට ආවේ නම් පන්සලට හා හාමුදුරුවන්ට බාධා නොකර ආගමික වතාවත් කරගන්නා ලෙසය. එමෙන්ම තමා පැවසූ ස්ථානයේම ගිනි පෑගීම කරන ලෙසද ඔහු උපදෙස් දුන්නේය.

මෙම අවස්ථාවේදී ගිනි පෑගීම වෙනුවෙන් සූදනමින් සිටි බැතිමත්හු ආවේගශීලි වී හූ හඬින් සහ හරෝහරා යනුවෙන් කෑ ගසමින් කපු මහතා පලවා හැරි අතර ඔහුගේ ආරක්ෂකයන් හා පොලිසිය එක්ව බස්නායක නිලමේවරයා සහ විහාරාධිපති හිමියන් ආරක්ෂා කරගෙන පසෙකට රැගෙන ගියේය.

මේ සම්බන්ධයෙන් කිසිදු පැමිණිල්ලක් නොලැබුණු බවත් 30 වැනිද රාත්‍රියේ ඇතිවූ ගැටලුව පොලිසිය මැදිහත් වී එදින රාත්‍රියේම නිරාකරණය කළ බවත් කතරගම රුහුණු මහා කතරගම දේවාලයේ ආරක්ෂාව අධීක්ෂණය කරන තංගල්ල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කේ.බී. කීර්තිරත්න අරුණ, කළ විමසුමකදී කියා සිටියේය.

## පොල් අයිස්ක්‍රීම් කවන්න යයි

නිර්මාණී තිලකසිරි

දේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගනිමින් පොල් ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදනයක් ලෙස පොල් අයිස්ක්‍රීම් වෙළෙඳපොළ වෙත නිෂ්පාදනය කිරීමේ හැකියාව පවතින බව පොල් පර්යේෂණ ආයතනය සඳහන් කරයි.

මේ වනවිටත් දේශීය වෙළෙඳපොළ තුළ මෙන්ම විදෙස් වෙළෙඳපොළ තුළද විවිධ රසැති අතුරුපස වර්ග දක්නට ලැබෙන නමුත් තවමත් අයිස්ක්‍රීම් වැනි අතුරුපසක් ලෙස පොල් භාවිත කරනු දක්නට නොලැබේ.

නමුත් පොල් පර්යේෂණ ආයතනය විසින් සිදුකරන ලද පර්යේෂණයකින් අනතුරුව පොල් අයිස්ක්‍රීම් නිෂ්පාදන තාක්ෂණය හඳුනාගෙන ඇති අතර, එම ආයතනය හරහා නිෂ්පාදන සිදු කිරීම පිළිබඳ දැනුම ලබාගැනීමට හැකිවේ.

කාබනික පොල් වගාවෙන් ලබාගන්නා එළදව උපයෝගි කරගනිමින් පොල් අයිස්ක්‍රීම් නිෂ්පාදනය කරන අතර, එළකිරි හෝ වෙනත් පිටිකිරි වර්ග කිසිවක් භාවිත නොකර සියයට සීයක් පොල් ආශ්‍රිත සෞඛ්‍ය සම්පන්න අතුරුපසක් ලෙස මෙම නිෂ්පාදනය සිදුකළ හැකි බව පොල් පර්යේෂණ ආයතනය පෙන්වා දෙයි.

### ශෝක ප්‍රකාශය



උපත 1969 10 04

මරණ 2023 07 01

## ශ්‍රීලන්කන් ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනාවලිය හදන්න බාරදෙයි

නිලන්ත මදුරාවල

ශ්‍රී ලංකන් ගුවන් සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමේ ව්‍යාපෘති යෝජනාවලිය සකස් කිරීම ලෝක බැංකුවට අනුබද්ධිත ජාත්‍යන්තර මූල්‍ය ආයතනයට (International Finance Corporation) භාර දෙනු ලැබ ඇත.

ආයෝජකයන්ට ආකර්ෂණය වන ආකාරයට ආයතන ව්‍යුහය සකස් කිරීම එම ආයතනයට පැවරී තිබෙන අතර ඒ සම්බන්ධයෙන් කෙරෙන ප්‍රතිසංස්කරණ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුවට සිදු වන බවත් ඒ අනුව ගුවන් සමාගමේ ණය ප්‍රමාණය වන ඇමරිකානු ඩොලර් බිලියන එකයි දශම හය ආණ්ඩුවට දරා ගැනීමට සිදු විය හැකි බවත් ඉහළ පෙළේ ආරංචි මාර්ග පැවසීය.

ගුවන් සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමට නියමිතව ඇත්තේ සියයට පනස් එකක කොටස් රජයට හිමි වන ආකාරයට ය. සියයට හතළිස් නවයක කොටස් සහ කළමනාකාරීත්වය පෞද්ගලික අංශය යටතට පත් කිරීමට නියමිත ය.

මෙවැනි ආයතනයක් සකස් කරන ව්‍යාපෘතියක ජාත්‍යන්තර පිළිගැනීම ඉතාමත් ඉහළ තත්ත්වයක පවතින බව ද ඉහත ආරංචි මාර්ග සඳහන් කළේය.

1998 වසරේ දී එයාර් ලංකා සමාගමේ කොටස් සියයට හතළිහක් ඇමරිකානු ඩොලර් මිලියන හැත්තෑවකට එමිරේට්ස් ගුවන් සමාගමට විකිණීමට හැකි වූයේ චෙස් මැන් හැටන් නම් බැංකුව විසින් සකස් කරන ලද ව්‍යාපෘති යෝජනාවලියක් අනුව ය. එම යෝජනාවලිය සකස් කිරීම එම බැංකුවට පවරා ඇත්තේ එවකට පැවැති රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ය.



උපන්දිනය වෙනුවෙන් කුඩා දරුවන් බැලුම්බෝල අහසට යැවූ අයුරු

## 87වැනි උපන් දිනයදා

# දෙහිවල සත්තුවත්තේ සතුට උතුරයි

- සත්තුන්ටත් උපන් දින කේක්
- සිංහ අරණ නමින් සිංහයන්ට අලුත් වාසභවනක්



උපන්දිනය සමරා පළමු කේක් කෑල්ල මැකෝ ගිරවෙකුට

## ◆ මියගිය සතුන් වෙනුවෙන් ලේ දන් දීමේ පින්කමක්



අලුතින් සෑදූ සිංහ අරණ

## ◆ ළමා ළපටින්ටත් අතක් බරට තෑගි

ආසියාවේ හොඳම සත්ත්වෝද්‍යානය ලෙස නම් දරා සිටින දෙහිවල සත්ත්වෝද්‍යානය ඊයේ (3 වැනිදා) සිය 87 වැනි උපන්දිනය සැමරුවේය.

දෙහිවල සත්ත්වෝද්‍යානය සිය 87 වැනි උපන්දිනය සැමරීම නිමිත්තෙන් වැඩසටහන් රාශියක් සංවිධානය කර තිබුණි. වනජීවි හා වන සංරක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් චන්ද්‍රා හේරත්, ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තිලක් ප්‍රේමකාන්ත ඇතුළු සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තු නිලධාරින්ගේ සහභාගීත්වයෙන් මෙම වැඩසටහන් සිදු කෙරිණි.

දෙහිවල සත්ත්වෝද්‍යානයේ උපන්දිනය සනිටුහන් කරමින් අමාත්‍යාංශ ලේකම් චන්ද්‍රා හේරත් මහත්මිය විසින් කේක් කපා එහි පළමු කේක් කෑල්ල සතුන්වත්තේ මැකෝ ගිරවෙකුට කැව්වාය. දෙහිවල සතුන්වත්තේ සිංහයන් වෙනුවෙන් අලුතින් ඉදිකළ "සිංහ අරණ" විවෘත කිරීමද ඇයගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි.

එමෙන්ම ඊයේ දිනයේදී වයස අවුරුදු 12න් පහළ දරුවන් සඳහා නොමිලයේ සත්ත්වෝද්‍යානයට ඇතුළු වීමට අවස්ථාව ලබා දී තිබූ අතර විශාල පිරිසක් ඊයේ පැමිණ සිටි ආකාරය දක්නට හැකිවිය.

සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් දීපව්‍යාප්තව පැවැත්වූ චිත්‍ර තරගවලින් හා ඡායාරූප තරඟවලින් ජයග්‍රහණය කළ දරු දැරියන්ට ත්‍යාග ලබා දීමද ඊයේ(3) සිදුකෙරිණි. එමෙන්ම සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ සේවය කළ පැරණිතම සාමාජිකයන් දස දෙනකුට උපහාර පුද කිරීමද සිදුවිය.

දෙහිවල සත්ත්වෝද්‍යානයේ උපන්දිනය නිමිති කොටගෙන මියගිය සතුන් සිහිකර ඉකුත් 30 වැනිදා ලේ දන්දීමේ පින්කමක් ද 1 වැනිදා සත්ත්වෝද්‍යානයට පිටත සතුන් සඳහා සත්ත්ව වෛද්‍ය සායනයක්ද පැවැත්විණි. දෙහිවල සතුන්වත්ත නැරැඹීමට පැමිණෙන ජනතාව හා සත්ත්වෝද්‍යාන සේවකයන් උදෙසා විනෝදාත්මක වැඩසටහන් රැසක් සංවිධානය කර තිබිණි. සත්ත්වෝද්‍යාන සේවකයන් සඳහා ආයුර්වේද වෛද්‍ය සායනයක්, දන්ත සායනයක් හා අක්ෂි සායනයක් එළැඹෙන 6, 7 හා 11 දිනයන්හි පැවැත්වීමට නියමිතය.

1936 වර්ෂයේදී ආරම්භ කළ දෙහිවල සත්ත්වෝද්‍යානය ආසියාවේ පිහිටා ඇති පැරණිතම සත්ත්වෝද්‍යානය වේ. වාර්ෂිකව මිලියන 1.5 ක් පමණ දෙස් විදෙස් සංචාරකයන් එය නැරඹීමට පැමිණේ. දෙහිවල සත්වෝද්‍යානය ක්ෂීරපායී විශේෂ 72ක්, කුරුළු විශේෂ 65ක්, උරග විශේෂ 31ක්, මත්ස්‍ය විශේෂ 89ක්, සමනළ විශේෂ 30ක් හා උභය ජීවින් තුන්දහසකට ආසන්න සංඛ්‍යාවකින් සමන්විතය. රුපියල් මිලියන දහසක පමණ මුදලක් වාර්ෂිකව රාජ්‍ය ආදයමට බැර කරන්නට ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට හැකිව තිබේ.

■ අනීෂා මානගේ
■ ජේ.පී. ඥානතිස්ස - බොරලැස්ගමුව



# කතුවැකිය

ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
අංක 91, විජේරාම මාවත, කොළඹ 7.
දුරකතන : 0115 200 900
ෆැක්ස් : 0112 673 451
ඊ මේල් : aruna.editor@liberty.lk
කර්තෘමණ්ඩලය : 0115978982, 0115978985 ෆැක්ස් : 0112 673451
දැන්වීම් : 0112 672601, 0112 672603 ෆැක්ස් : 0112 672648
බෙදාහැරීම : 0112 127204, 0112 127210 ෆැක්ස් : 0112 455134
වෙබ් : www.aruna.lk
Follows us on https://www.facebook.com/aruna.lk.official
Follow us on https://twitter.com/arunapuwath
Follow us on https://www.instagram.com/aruna.lk

## පොලිස්පති පත් කිරීමට කාදිනල් අනුමැතිය?

හිස්ව තිබෙන පොලිස්පති පුටුව සඳහා පත් කළ යුතු හා නොකළ යුතු නිලධාරීන් සම්බන්ධයෙන් තදින් කරුණු දක්වා මැල්කම් රංජිත් කාදිනල් කොළඹ අගරදගුරුවරයා විසින් ජනාධිපතිවරයාට ලිපියක් යවා ඇතැයි දැනගන්නට ලැබේ. මාධ්‍ය මගින් හෙළිකර තිබෙන කරුණු අනුව දැනට පොලිස්පති ධුරය සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරු දෙදෙනකු සම්බන්ධයෙන් කාදිනල්වරයා තම නොකැමැත්ත පළකර තිබේ. එම නොකැමැත්ත කතෝලික ජනතාවගේ මතු නොව රටේ මහජනතාවගේ අභිලාෂය බවද ඔහු අවධාරණය කර තිබෙන බව පෙනේ. එසේම ඒ සඳහා ප්‍රධාන සාධකයක් සේ කාදිනල්වරයා දක්වා තිබෙන්නේ පාස්කු පරීක්ෂණ කටයුතු ආදිය සම්බන්ධයෙන් බලන කල පොලිස්පති ධුරයට පත්කිරීමට යෝග්‍ය ලේඛනයේ ඉහළින්ම සිටින ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන සහ කොළඹ පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තේන්නකෝන් යන දෙදෙනා අයෝග්‍ය බවය. ඔවුන් සම්බන්ධයෙන් කිසිසේත්ම සෑහීමකට පත්වීමට නොහැකි බව කාදිනල්වරයා අවධාරණය කරයි. සැබැවින්ම කාදිනල්වරයාගේ ලියුම අපට පෙනෙන්නේ හතරබීරි කතාවක් සේය. මූලික වශයෙන් රටේ පොලිස්පති පුටුව හිස්ව තිබෙන පසුබිමක ඒ සඳහා නිලධාරියකු පත්කිරීමට ආණ්ඩුව සූදානම් වන අවස්ථාවේ ඊට බලපෑම් කිරීමට කාදිනල්වරයාට තිබෙන නෛතික සහ සදාචාරාත්මක හිමිකම කුමක්ද යන්න මෙහිලා මූලික ගැටලුවයි. ඒ ගැටලුව පසෙක තිබේවා!.

කාදිනල්වරයා සඳහන් කරන ආකාරයට ඔහු මෙම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්ට විරෝධය පළකිරීමට පදනම් කරගෙන තිබෙන ප්‍රධාන තර්කයක් වනුයේ පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් කෙරෙන පරීක්ෂණ කටයුතුවලදී ඔවුන් අතරින් කවරකු හෝ පොලිස්පති ධුරයේ සිටීම අයෝග්‍ය බව සඳහන් කිරීමය. සැබැවින්ම පොලිස්පතිවරයකු පත්කරන්නේ පාස්කු පරීක්ෂණ කටයුතු පමණක් කරගෙන යාමට නම් මෙම තර්කයේ යම් පදනමක් තිබේ. එහෙත් පොලිස්පතිවරයකුගේ ප්‍රධාන කාර්යය එය නොවන බව කාදිනල්වරයාට නොවැටහීම පුදුමයට කරුණකි.

පසුගිය ආණ්ඩු කාලේ කාදිනල්වරයා පාස්කු ප්‍රහාරයට වගකිව යුතු මහ මොළකරුවකු පිළිබඳ කෑමොර දුන්නේය. දැන් මහා මොළකරුවා කතාවට වෙච්ච දෙයක් නොමැත. එය කාදිනල්වරයාටද අමතක වී ඇති සැටියකි. කොහොම කෙසේ වෙතත් රටේ නීතිය හා සාමය පවත්වාගෙන යාම සඳහා හිස්ව තිබෙන පොලිස්පති පුටුවට සුදුස්සෙක් පත්කර ගත යුතුමය. දැනටමත් එය ප්‍රමාද වීම එතරම් යෝග්‍ය නොවන බවද අමුතුවෙන් සඳහන් කළ මනා නොවේ. එහෙත් මෙවැනි පදනම් විරහිත බලපෑම් සුදුසු නිලධාරියකු පොලිස්පති ධුරයට පත්කිරීමට ප්‍රබල බාධාවක් වී තිබෙන බව පෙනේ. පොලිස්පතිවරයකු පත්කිරීමේ බලය තිබෙන්නේ ජනාධිපතිවරයාට සහ පොලිස් කොමිසමටය. එකී පටිපාටිය නොතකා පොලිස්පති ධුරයට පත් කළ යුතු හා නොකළ යුතු නිලධාරීන් සම්බන්ධයෙන් මෙසේ බලපෑම් කිරීම මගින් පෙනෙන්නේ කාදිනල්වරයා තමාගේ සීමාව ඉක්මවා තිබෙන බවය. රටේ මහජනතාවගේ ප්‍රශ්න සම්බන්ධයෙන් ආගමික නායකයන් මුනිවත රැකිය යුතු යැයි අප කිසිසේත්ම සඳහන් කරන්නේ නැත. එහෙත් කතා කළ යුතු මහජන ප්‍රශ්න ඕනෑතරම් තිබියදී මෙවැනි කරුණක් සම්බන්ධයෙන් බලපෑම් කිරීම අපට පිළිගත නොහැකි ප්‍රවේශයකි. පොදුවේ බලන කල මෙරට ආගමික නායකයන් සේම දේශපාලනඥයන් තම තමන්ගේ විෂය වපසරිය පටලාගෙන තිබෙන්නේ අද ඊයේ නොවේ. එසේ පටලවා ගැනීමේ උපරිම අවස්ථාව සේ 1959 බණ්ඩාරනායක ඝාතනය දැක්විය හැකිය. එනිසා ආගම සහ රාජ්‍ය අතර ගැටුමකට මග විවර නොවිය යුතුය. ලෝක ඉතිහාසය බලන විට මෙම ගැටුම නිසා අනවශ්‍ය අර්බුද රැසක් උද්ගත වූ අවස්ථා ඕනෑ තරම් දැකිය හැකිය.

විශේෂයෙන් කාදිනල්වරයාගේ ලිපිය සම්බන්ධයෙන් තිබෙන තවත් ප්‍රධාන ගැටලුවක් නම් එම ලිපිය මගින් නිලධාරීන් දෙදෙනකු ඔහු නම්කර තිබීමය. එය කෙතරම් යෝග්‍ය පියවරක්ද යන්න සලකා බැලිය යුතුය. රාජ්‍ය තීන්දු තීරණ ගත යුත්තේ තමන්ට ලැබී තිබෙන මහජන වරම අනුවද නොඑසේනම් ආගමික නායකයන්ගේ උපදෙස් හෝ බලපෑම් අනුවද යන ගැටලුව ඇතිවීම නොවැළැක්විය හැකිය. 'ජෝන්ගේ දේ ජෝන්ටත් සීසර්ගේ දේ සීසර්ටත් දෙන්නැයි' කියමනක් යුරෝපයේ තිබේ. එමගින් අදහස් කරනුයේ ආගමික භූමිකාව සහ රාජ්‍ය භූමිකාව පටලවා නොගත යුතු බවය. පසුගිය කාලයේ රටේ සමහර ගැටලු අනවශ්‍ය තැනකට තල්ලු වී ගියේ ආගමික නායකයන්ගේ පදනම් විරහිත බලපෑම් නිසා බව සඳහන් කිරීම සාවද්‍ය නොවේ. ආණ්ඩුවට ප්‍රශ්න විසඳ ගැනීමට ඉඩදිය යුතු බොහෝ අවස්ථාවලදී ආගමික නායකයෝ සහ යම් යම් ආගමික කණ්ඩායම් අනවශ්‍ය බලපෑම් කළහ. මහජනතාව කුපිත කළහ. රටක ඉදිරි පියවර සම්බන්ධයෙන් බලන විට එය ප්‍රබල හානියකි. රාජ්‍යය රටේ ප්‍රශ්නයන් දෙස බලන්නේ දේශපාලන දෘෂ්ටිකෝණයකිනි. බොහෝ විට එම දෘෂ්ටිකොණය විවිධ කරුණු සලකා බලා සමබරව ඇතිකර ගන්නා එකක් විය හැකිය. එහෙත් බොහෝ දුරට ආගමික දෘෂ්ටිකෝණයක එවැනි සමබර කරුණු සලකා බැලීමක් දැකිය නොහැකිය. එයට හොඳම සාක්කිය කාදිනල්වරයාගේ ලියමනය. මෙවැනි දෘෂ්ටිකෝණ සහ බලපෑම් සම්බන්ධයෙන් පසුගිය කාලයේ සමාජ විරෝධයක් මතු වූ බව අමතක නොකළ යුතුය. රටේ පාතාල ක්‍රියාකාරකම් ඇතුළු අපරාධ වර්ධනය වී තිබෙන පසුබිමක පොලිස්පති ධුරය වැනි අතිශය වැදගත් භූමිකාවකට සුදුසු නිලධාරියකු පත්නොකර තබා ගැනීම කිසිසේත්ම යෝග්‍ය නොවේ. එනිසා ආණ්ඩුව මෙවැනි ආගමික අනාගමික බලපෑම් නොතකා හිස්ව ඇති පොලිස්පති පුටුවට නොපමාව සුදුසු නිලධාරියෙකු පත්කර ගැනීමට පියවර ගත යුතුය.

---

# මහ බැංකුවේ මුදල් මණ්ඩලය මේ දවස්වල 'ඩබල් ඇක්ටින්'



**මෙරට බැංකු පද්ධතියේ ඉතිහාසයේ දීර්ඝ නිවාඩුව අවසන් වන්නේ අදය. පසුගිය බ්‍රහස්පතින්දා සිට දින පහක කාලයක් බැංකු වසා තිබුණේ දේශීය ණය ප්‍රශස්තකරණය වෙනුවෙනි. දැන් එම කටයුතු නිමව ඇත. ඒ පිළිබඳ වූ විවාදය මේ දිනවල පාර්ලිමේන්තුවේ දී සිදුවේ. මේ ණය ප්‍රශස්තකරණය සමාජ ආරක්ෂණ අරමුදල්වලට සහ ජනතාවට බලපෑම් කරන්නේ කෙලෙසින් ද යන්න පිළිබද මේ විමසුම ශ්‍රී ලංකා මහ බැංකුවේ හිටපු නියෝජ්‍ය අධිපති ආචාර්ය ඩබ්ලිව්. ඒ. විජේවර්ධන සමගය.**

**දවස් පහක් බැංකු වහගෙන දේශීය ණය ප්‍රතිව්‍යුහගත කරනවා කියලයි රජය මුලින් කිව්වෙ. නමුත් දැන් කියන්නේ ප්‍රශස්තකරණය කරනවා කියලයි. වචන මාරු කරමින් රජය මොකක්ද මේ කරන්නෙ...**

ඇත්තටම ප්‍රතිව්‍යුහගත කරනවා කියන්නෙ හා ප්‍රශස්තකරණය කියන්නෙ ක්‍රම දෙකක් කියල මුලින් අපි අවබෝධ කර ගන්න ඕනේ. ප්‍රතිව්‍යුහගත කරනවා කියන්නෙ ශ්‍රී ලංකාව ලබා ගෙන ඇති විදේශ ණය සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා මාර්ගයක්. ප්‍රශස්තකරණය (optimization) කියල කියන්නෙ රජය ලබා ගෙන ඇති දේශීය ණය සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා මාර්ගය.

ප්‍රතිව්‍යුහගතකරණයේදී සිදු වන්නේ ණයගැතියා විසින් ණය හිමියා එක්ක සාකච්ඡා කර ණය ගෙවීමට ඇති කර ගෙන තිබෙන කොන්දේසි වෙනස් කරවා ගැනීම. ප්‍රශස්තකරණයෙදි වෙන්නෙ ණය හිමියා තමන්ට සිදු විය හැකි ලාභය උපරිම කර ගැනීම හෝ අලාභය අවම කර ගැනීමට කටයුතු කිරීම.

දේශීය ණය සම්බන්ධයෙන් ණය හිමියාට තිබෙන්නෙ අලාභයක් කියල බැලූ බැල්මට පේනවා. මොකද ණය ලබා ගෙන ඇති රජය ඒ ණය නොගෙවා අතහැර දැමිය හැකි තත්ත්වය වැඩි නිසා ඒ අලාභය අවම කර ගැනීමේ ක්‍රියාමාර්ගයක් විදියට තමයි ණය ප්‍රශස්තකරණය හඳුන්වා දී තිබෙන්නෙ. මේ වැඩපිළිවෙළ යටතේ ශ්‍රී ලංකාවේ ණය හිමියන් සමග සාකච්ඡා කරලා දේශීය ප්‍රශස්තකරණ වැඩපිළිවෙළ කඩිනම් කර ගැනීම සඳහා අවශ්‍ය බලය පාර්ලිමේන්තුව විසින් මේ වන විට මුදල් අමාත්‍යවරයාට ලබා දී තිබෙනවා.

**මේ ක්‍රියාවලියෙදි සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල හා විශ්‍රාම වැටුප් අරමුදල පමණයි යොදා ගන්නෙ කියල ආණ්ඩුව කියනවා. එතකොට ඒ අරමුදල්වලට මොනවා වෙයි ද?**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඇති යෝජනාව අනුවයි එය ක්‍රියාත්මක වෙන්නෙ. මහ බැංකුව සතුව තිබෙන භාණ්ඩාගාර බිල්පත්වල වටිනාකම රුපියල් බිලියන 2700ක් පමණ වෙනවා. එමෙන්ම මහ බැංකුව රජයට ලබා දී ඇති තාවකාලික අත්තිකාරම්වල වටිනාකම රුපියල් බිලියන 340 ක්. මේ අනුව රජය මහ බැංකුවට ණය වී ඇති ප්‍රමාණය රුපියල් බිලියන 3040ක්. මේ ණය මුදල පියවීමේදී අවුරුදු පහකට හා අවුරුදු 15 කදී කල්පිරෙන බැඳුම්කරයක් විදියට පරිවර්තනය කරල ඊට 5% පොලියක් අයකර ගන්නත් මහ බැංකුව යෝජනා කරලා තිබෙනවා. මෙහි දී ඇති විශේෂත්වය තමයි මහ බැංකුව විසින් ඉදිරිපත් කළ යෝජනාව ක්‍රියාත්මක කිරීම සුදුසුයි කියල ණය හිමියා විදියට මහ බැංකුවම පිළිගෙන තිබෙනවා.

ඒ අතරේ සේවක අර්ථසාධක අරමුදල් හා විශ්‍රාම වැටුප් අරමුදල්වල බැඳුම්කර සඳහා යෝජනා කර තිබෙන්නෙ පළමු වසර සඳහා 12%ක පොලියක් හා දෙවන වසරේ 9%ක පොලියක් ලැබෙන විදියට අවුරුදු 15ක දී කල් පිරෙන බැඳුම්කර බවට පත් කර ගන්න. මෙය ස්වේච්ඡාවෙන් සිදු කරන යෝජනාවක් විදියට තමයි සඳහන් වෙන්නෙ. නමුත් මෙම යෝජනා ඉදිරිපත් කිරීමේදී ස්වේච්ඡාවෙන් කියන එක වැරදියි. මොකද සේවක අර්ථසාධක අරමුදලේ භාරකාරත්වය තිබෙන්නෙ ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් මණ්ඩලය යටතේයි. එනිසා මේ අයතන ග්‍රහණයට (captive) හසුව ඇති ආයතන විදියට තිබෙන නිසා මේ යෝජනා ඒ ආයතන විසින් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් කළ යෝජනා විදියට පිළිගන්න බෑ.

**ඒ කියන්නෙ මේව සිද්ධ වෙන්නෙ බලහත්කාරකමින් ද?**

නෑ, මෙතැන බලහත්කාරකමක් සිද්ධ වෙනවා කියන්නත් බෑ. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය තමයි මේ අරමුදල්වල භාරකරු විදියට කටයුතු කරන්නෙ. ඒ මුදල් මණ්ඩලයම තමයි තමන් දුන්නු ණය ආපසු අය කර ගැනීමේදී මේ විදියට කටයුතු කළොත් හොඳයි කියල යෝජනා කරල තියෙන්නෙ. ඒ යෝජනා ක්‍රියාත්මක කරන්න තමන්ම එකඟව තිබෙනවා. මේ අරමුදල්වලට අමතරව පෞද්ගලික අංශයේ සේවක භාරකාර අරමුදලුත් තිබෙනවා. ඒ අය මේ යෝජනාවට කැමැති නැත්නම් ඔවුන්ගෙන් දැනට අය කරන බද්ධ 14% සිට 30% දක්වා වැඩි කරනවා කියල රජය දැනටමත් කියල තියෙනවා. ඒ අනුව පෞද්ගලික අංශයේ අරමුදල් හිමියන්ට සිද්ධ වෙනවා මහ බැංකුව ඉදිරිපත් කර තිබෙන යෝජනාවලට එකඟ වෙනවාද නැත්නම් 30%ක බද්ධ ගෙවනවාද කියල තීරණයක් ගන්න. මේ අනුව පෞද්ගලික අරමුදල් යොදවා භාණ්ඩාගාර බැඳුම්කර ගෙන ඇති අයටත් විකල්ප විසඳුමකට යන්න ඉඩක් නෑ. සේවක අර්ථසාධක අරමුදල බැංකුවේ මුදල් මණ්ඩලය යටතේ තිබුණත් සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල මුදල් අමාත්‍යාංශය හා කම්කරු අමාත්‍යාංශය පත් කරන මණ්ඩලයකින් තමයි පාලනය වන්නෙ. ඒ මණ්ඩලයට වෘත්තීය සමිති නියෝජිතයන් ද ඇතුළත්ව සිටිනවා. නමුත් රජයේ නියෝජිතයින් බහුතරයක් මෙහි සිටින නිසා වැඩි බලය ඔවුන් සතුව තිබෙනවා.

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු දේශීය ණය ප්‍රශස්තකරණ යොජනාවට කම්කරු අමාත්‍යවරයා හා මුදල් රාජ්‍ය අමාත්‍යවරු දෙදෙනාත් පක්ෂව ඡන්දය පාවිච්චි කර ඇති නිසා අපිට උපකල්පනය කරන්න පුළුවන් ස්වේච්ඡාවෙන් තොරව නියෝග අනුව මෙම ක්‍රියාදමයට සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලත් එකතු වෙනවා කියල.

**ඔබ කියන විදියට සේවක අර්ථසාධක අරමුදලේ භාරකාරයා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වුවත් මේ මුදල්වල අයිතිය තිබෙන්නෙ මෙරට වැඩ කරන ලක්ෂ 26ක ජනතාවටයි. එහෙම තිබියදී මේ අරමුදල් පිළිබඳ තනිව තීන්දු ගන්න මහ බැංකුවට තිබෙන නෛතික බලය මොකක්ද?**

ඔබ ඉදිරිපත් කරන තර්කය ඉතාම පැහැදිලියි. නමුත් අවාසනාවකට 1958 ඉදිරිපත් කර තිබෙන සේවක අර්ථසාධක අරමුදල් පනත අනුව මේ මුදල්වල අයිතිකරුවෝ විදියට සැලකෙන වැඩ කරන ජනතාවට මේ අරමුදල සම්බන්ධයෙන් ගනු ලබන තීන්දු තීරණවලට මැදිහත් විය හැකි පහසුකම් සලසා නෑ. මේකට තිබෙන හොඳම උදාහරණයක් තමයි අපි බැංකුවල මුදල් තැන්පත් කිරීමේදී සිදුවන ක්‍රියාදමය. අපි මුදල් තැන්පත් කළාට ඒවාට මෙච්චර පොලියක් ඕනේ කියල අපිට කියන්න බෑ. අනෙක අපි තැන්පත් කරන මුදල් වෙන දේවල්වලට යොදවලා කොපමණ ලාභයක් උපයනවාද කියල අපිට හොයා බලන්න අයිතියක් නෑ.

මේකම තමයි අර්ථසාධක අරමුදලේ වෙන්නෙත්. බැංකුවල අදයම වියදම පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුව නියාමනය කරනවා. සේවක අර්ථසාධක අරමුදලේ භාරකාරිත්වය තිබෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය තමන් විසින් තමන් පාලනය කර ගැනීමක් තමයි සිද්ධ වෙන්නෙ. මහ බැංකුවේ මුදල් මණ්ඩලයට භූමිකා දෙකක් රඟපාන්න සිදුව තිබෙනවා. එකක් තමයි අර්ථසාධක අරමුදලේ භාරකරු විදියට මේ අරමුදලේ සාමාජිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතුයි. අනෙක් කාරණය තමයි ආණ්ඩුවේ නියෝජිතයින් විදියට ආණ්ඩුව ක්‍රියාත්මක කරන මේ ප්‍රශස්තකරණය වැනි වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම. මෙය ටිකක් දුෂ්කර කාර්යයක්. මේ නිසාම මෙවැනි කටයුතුවලදී විනිවිදභාවයෙන් යුතුව කටයුතු කරන්න ඕනේ. එහෙම නොවුණොත් ගැටුම් ඇති විය හැකි ප්‍රවණතා වැඩියි.




**දේශීය ණය ප්‍රශස්තකරණ යෝජනාව අනුව පාර්ලිමේන්තුව මුදල් අමාත්‍යවරයාට අසීමිත බලයක් පවරා ඇති පසු බිමක දේශීය ණය කපා හැරීමක් සම්බන්ධයෙන් තීන්දු ගන්නත් පුළුවන් නේද?**

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග පැවැත්වෙන සමාලෝචන රැස්වීම සැප්තැම්බර් මාසයේ පවත්වන්න නියමිතව තිබෙනවා. ඒ අනුව ඊට පෙර ඉටුකර ගතයුතු කාරණයක් හැටියට තමයි විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය සැලකෙන්නෙ. නමුත් මේ අතරේ ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර මිල දී ගත් කණ්ඩායමක් යෝජනා කර තිබෙනවා ජාත්‍යන්තරව රජය ලබා ගත් ණය ප්‍රතිව්‍යුහගත කරන ආකාරයටම දේශීය ණයත් ප්‍රතිව්‍යුහගතකරණය විය යුතුයි කියල. ඒ අනුව යමින් තමයි පාර්ලිමේන්තුව මුදල් අමාත්‍යවරයාට මේ කටයුතු කඩිනමින් ඉටු කර ගැනීම සඳහා බලය පවරා දී තිබෙන්නෙ. මුදල් අමාත්‍යවරයා මේ කටයුතු ඉටු කිරීමේදී ඉතාම සැලකිල්ලෙන් විනිවිදභාවයෙන් යුතුව කටයුතු කළ යුතුයි. ඒ වගේම මහ බැංකුවේ වෘත්තීය සමිති නියෝජිතයින් සමගත් මේ සම්බන්ධයෙන් අදහස් හුවමාරු කර ගෙන ඔවුන්ගේ අදහස් ගැනීමත් වැදගත් වේවි කියල මම හිතනවා. මොකද මහ බැංකුවේ ප්‍රාග්ධනය හීන වීම බැංකුවේ සේවකයින්ටත් යම් බලපෑමක් සිදු කරන නිසා එලෙස ඔවුන් සමගත් සාකච්ඡා කිරීම හොඳයි.

**ශ්‍රී ලංකාවේ රජය ලබා ගෙන ඇති ණය තොගය ගෙවන්න අලුත් ආදායම් මාර්ග ගැන රජයේ අවධානය යොමුව නෑ නේද?**

දැනට තිබෙන තොරතුරු අනුව විදේශ ණය තොගයෙන් ඩොලර් බිලියන 14 ක් කපා හරින්නට යෝජනා වී තිබෙනවා. ඉදිරි වසර පහ ඇතුළත ඒ ණය කපා හැරීමක් සිදු වුවහොත් අපේ ණය තොගය අඩු වෙනවා. ඒ එක්කම ජනාධිපතිවරයා සඳහන් කර තිබුණා ඉදිරි වසර පහ ඇතුළත විදේශ ණය ඩොලර් බිලියන 17ක් කපා හරින්න ඕනේ කියල. එහෙම කියන්න හේතුව අප ණය ගෙවීම පැහැර හැර ඇති කාලයට එකතුව ඇති පොලි වාරිකවල එකතුවත් කපා හැරිය යුතුයි කියන එකයි. මේ විදියට විදේශ ණය කපා හැරිමක් සිදු වුව හොත් අපේ විදේශ ණය 50% කින් පමණ අඩු විය හැකියි.

**රජය අනුගමනය කරන දේශීය ණය ප්‍රශස්තකරණයේදී ජනතාවගෙන් කොටසකට විතරක් වැඩි බලපෑමක් එල්ල වෙනවා කියල සමහර අය චෝදනා කරනවා. මේ ගැන මොනවද කියන්නෙ?**

මෙම ප්‍රශස්තකරණය නිසා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාග්ධනය අඩු විය හැකි බව මහ බැංකුවම කියනවා. එහෙම වුණොත් ඒ අඩු වෙන ප්‍රමාණය සැපයිය යුත්තේ මුදල් අමාත්‍යාංශයයි. මුදල් අමාත්‍යාංශය කියන්නෙ රටේ මහජනතාව තමයි ඒ අයගේ බදු මුදලින් මේ අඩුව සපුරා දෙන්න වෙන්නෙ. අර්ථසාධක අරමුදල විශ්‍රාම වැටුප් අරමුදල වැනි අරමුදල් පිහිටුවා තිබෙන්නේම සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙළක් විදියටයි. ඒ අනුව මේ ප්‍රශස්තකරණයේ මුළු බර සමාජයේ ආරක්ෂාවක් අවශ්‍ය මහලු අයගේ උර මත පැටවීම එක්තරා විදියකට සමාජ සාධාරණත්වය පිළිබඳව ගැටලුවක් විදියට මම දකිනවා. අනෙක මම මුලින් කීව විදියට ඉදිරියට පත්වෙන ආණ්ඩුවලට තමයි මෙහි වැඩි බලපෑම එල්ල වෙන්නෙ. එයින් අදහස් කරන්නෙ අනාගත පරපුරටත් මේ බරට කර ගහන්න වෙනවා කියන එකයි.

■ සංවාදය - ජයසූරිය උඩුකුඹුර

---

## ගපිරිගේ කවිය

### කාදිනල්තුමාගේ කතාව

කාදිනල්තුමා කී කරුණක් ඇහුණා
"ජාතිය වහල් බවකට පත්කර දමනා
තත්ත්වෙකි නායකය දැන් කර කර සිටිනා
අයි.එම්.එෆ් මඟින් අපි රැකඩ කරනා"

පුදුමාකාර ජාතික කැක්කුමක් ඇතී
හුඟදෙන මේව අත්දැක දැක නිහඬ වෙතී
එතුමගෙ කතාවේ නිර්භය කමක් ඇතී
අපි වාගෙම ලෝකෙටත් පණිවුඩය දෙතී

# අත්තනගලු ඔයේ නාද්දී සෙල්ෆි ගන්න ගිය තරුණිය අතුරුදන්

■ මනෝජ් එදිරිසිංහ - මීරිගම

අත්තනගලු ඔයේ තිහාරිය, දූල්මල ජල මාපකය අසලදී මිතුරන් පිරිසක් සමග දිය නෑමට ගිය 21 හැවිරිදි තරුණියක පෙරේද (01 වැනිදා) දියේ ගිලී අතුරුදන්ව ඇත.

පොලිසිය, ගම්වාසීන් හා නාවික හමුදාව එක්ව පැය හතළිස් අටකට වැඩි කාලයක් මෙහෙයුම් සිදුකළද ඊයේ (03 වැනිදා) සවස වනවිටත් එම තරුණිය හමුවී නොතිබිණි.

මෙලෙස අතුරුදන්වී ඇත්තේ කොළඹ, ගුණසිංහපුර මහල් නිවාසවල පදිංචි ෆාතිමා ෆ්ස්ලා නමැති 21 හැවිරිදි තරුණියකි.

හජ් උත්සවය සැමරීමෙන් පසු ඇය පසුගිය 01 වැනිදා යෙහෙළියක සමග තිහාරිය ප්‍රදේශයේ ඥාති නිවසකට පැමිණ ඇත. එදින එම නිවසෙන් දහවල් ආහාරය ගෙන පසුව පස්වරු 04.00ට පමණ ඇය යෙහෙළියන් සහ ඔවුන්ගේ සහෝදරයන් සමග තිහාරිය, දූල්මල ප්‍රදේශයේ ජල මාපකය අසල දිය නෑමට ගොස් තිබේ.

දිය නෑමට පෙර එම පිරිස සෙල්ෆි ඡායාරූපයක් ද ගෙන තිබිණි. මද වේලාවක් දිය නාමින් සිටි ෆාතිමා ගලක් මතට නැග තිබුණේ සෙල්ෆි ඡායාරූපයක් ගැනීමටය. එම අවස්ථාවේ පය ලිස්සා ඔයට ඇද වැටී තිබුණු ඇය "අනේ මට පීනන්න බෑ. මාව අල්ලගන්න" යැයි කියමින් කෑ ගසා ඇතත් කිසිවකුට ඇය බේරාගැනීමට හැකිවී නැත.

ඇයගේ මිත්තණිය සිය මිනිබිරියට අත්වූ ඉරණම ගැන මෙසේ පැවසුවාය.

"මම මේ දරුවට යන්න එපා කියලා කිව්වත්, ආච්චි මම යාළුවත් එක්ක ගිහින් හවස ඉක්මනට එන්නම් කියලා තමයි ගියේ. එහෙම කියලා යාළුවත් එක්ක යාළුවගේ තිහාරියේ නෑදෑ ගෙදරකට ආවේ. දුව නාලා ඉවර වෙලා ෆොටෝ එකක් ගන්න කියලා ගලක් උඩට නැගලා තියෙනවා. එතකොට තමයි පය ලිස්සලා වැටිලා තියෙන්නේ."

ෆාතිමා සමග දිය නෑමට ගිය යෙහෙළියක ද මෙසේ අදහස් දැක්වූවාය.

"අපි හවස බත් කාලා අත්තනගලු ඔයට නාන්න ගියා. එයා නාමින් ඉන්න විට හදිස්සියේ ලිස්සලා වැටුණා. අනේ මට පීනන්න බෑ මාව බේරගන්න කියලා කෑ ගැහුවා. අපි බේරගන්න හැදුවත් අපිට බේරගන්න බැරි වුණා. එයා අත් දිගු කරමින් ඇතට නොපෙනී ගියා."

**මට පීනන්න බෑ මාව අල්ලගන්න කියා එයා කෑ ගැහුවා**

**- යෙහෙළිය කියයි**



දිය නෑ ස්ථානය

**ෆාතිමා සොයා පැය 48ක මෙහෙයුමක්**



අතුරුදන් වූ ෆාතිමා ෆ්ස්ලා

# රාජකීය සිසුවකුගෙන් රාජකීය වැඩක්

## කෘතිම බුද්ධියෙන් වැඩ කරන යෙදවුමක් හදලා

පාසල් සිසුන්ට, විශ්වවිද්‍යාල සිසුන්ට, ගුරුවරුන්ට මෙන්ම විවිධ ක්ෂේත්‍රවල සිටින බොහෝදෙනකුට ප්‍රයෝජනවත් වන කෘතිම බුද්ධිය භාවිතයෙන් පරිශීලනය කළ හැකි වෙබ් පිටුවක් සහ පරිගණක යෙදවුමක් මෙරට විශ්වවිද්‍යාල සිසුවකු විසින් පළමු වරට හඳුන්වාදී ඇත.

කොළඹ රාජකීය විද්‍යාලයෙන් අධ්‍යාපනය ලද දිලුම් ලියනගේ සිසුවා විසින් සැකසූ මෙම https://www.scholalify.com වෙබ් පිටුව සහ පරිගණක යෙදවුම (Scholalify App) ඕනෑම අයකුට නොමිලේ පරිශීලනය කළ හැකි ලෙස ඉදිරිපත් කර තිබේ.

කැනඩාවේ, මෙමෝරියල් විශ්වවිද්‍යාලයේ පරිගණක විද්‍යාව පිළිබඳ උපාධි පාඨමාලාවේ අවසන් වසරේ ඉගෙනුම ලබන දිලුම් උසස් පෙළ ජීව විද්‍යාව, ගණිතය සහ සෙසු විෂයයන් ස්වාධීනව ඉගෙන ගත හැකි පරිදි මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රය උදෙසා මෙම වෙබ් පිටුව සහ යෙදුම නිර්මාණය කර ඇත.

මෙම යෙදුම මගින් විෂයයන් 25කට වැඩි සංඛ්‍යාවක් අධ්‍යයනය කළ හැකි අතර, Chat GPT AI Chatbot භාවිත කර පිළිතුරු ලබා ගත හැකිය. මෙහි විශේෂත්වය වන්නේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන ඕනෑම භාෂාවකින් සංවාදයේ යෙදීම සහ ඕනෑම විෂයකට අදාළව ප්‍රශ්න අසා පිළිතුරු දැනගැනීමට හැකි වීමය.

ජීව විද්‍යාව, ගණිතය, තාක්ෂණ විෂය, වාණිජ සහ කලා යන විෂයන් සඳහා මෙය විශේෂය. Scholalify app සහ වෙබ් අඩවියේ තවත් වටිනා ලක්ෂණයක් වන්නේ, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල සිසුන් සමග එක්ව විෂයානුබද්ධ ප්‍රශ්න විසඳගැනීමට හැකිවීමය.

2018 වර්ෂයේදී අ.පො.ස. උසස් පෙළ ගණිත අංශයෙන් සමත් වූ දිලුම්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයට තේරී පත් විය. නමුත්, ඔහු එම අවස්ථාව වෙනත් ශිෂ්‍යයකුට ලබාදෙමින් කැනඩාවේ මෙමෝරියල් විශ්වවිද්‍යාලයෙන් ශිෂ්‍යත්වයක් ලබා උපාධිය හැදෑරීමට එරටට ගියේය. ඔහු සිය උපාධිය සම්පූර්ණ කරන අතරතුර, AI භාවිතයෙන් පරිගණක යෙදවුමක් හා වෙබ් පිටුවක් නිර්මාණය කළ පළමු ශ්‍රී ලාංකිකයා බවට පත්විය.

ඕනෑම අයකුට තම ඊ මේල් ලිපිනය ඔස්සේ මෙම යෙදවුමට ලියාපදිංචි විය හැකි අතර, ScholalifyApp මගින් ඉදිරියේ දී තවත් බොහෝ දෑ හැදෑරීමට අවස්ථාව හිමි වනු ඇතැයි පැවසේ.

# සංඛපිට්ඨි විහාරයේ ධාතු මහා පෙරහර වීදි සරයි



සධාතුක කරඬුව තැන්පත් කරමින්.....

කඩුවෙල, කොතලාවල සංඛපිට්ඨි විහාරස්ථානයේ 180 වැනි ධාතු මහා පෙරහරේ සධාතුක කරඩුව තැන්පත් කිරීම 'අරමුණ' ව්‍යාපෘතියේ නිර්මාතෘ දිලිත් ජයවීර අතින් සිදු කෙරිණි.

මෙවර පෙරහර සඳහා විද්‍යුත් මාධ්‍ය අනුග්‍රහය 'ටී.වී. දෙරණ' ලබාදුන් අතර, මුද්‍රිත මාධ්‍ය අනුග්‍රහය ලබාදුන්නේ 'අරුණ' පුවත්පතයි.

ඡායාරූපය
රවී චතුරංග

# නුවරඑළිය සජබ අපේක්ෂකයෙක් අල්ලපු ගෙදරට මළපහ හරවලා

■ ආර්.එෆ්.එම්. සුහෙල් - නුවරඑළිය

තම නිවසේ මළ අපද්‍රව්‍ය, යාබද නිවසකට බැහැර කිරීම හේතුවෙන් නුවරඑළිය මහ නගර සභාවට තරග වදින සමගි ජන බලවේගයේ අපේක්ෂක අබ්දුල් රහීම්ට අසල්වැසියන් පිරිසක් පහර දී ඇත.

මේ හේතුවෙන් ඔහු මේ වන විට නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටින අතර, පහරදීම සම්බන්ධව රෝහල් පොලිසිය වෙත පැමිණිල්ලක් ද ඉදිරිපත් කර ඇති බව නුවරඑළිය පොලිසිය සඳහන් කළේය.

ඔහුගේ දේශපාලන තත්ත්වය පිළිබඳව කිසිදු තොරතුරක් නොදන්නා බවත් අබ්දුල් රහීම් නම් පුද්ගලයා වැසිකිළි බටයක් හා සම්බන්ධව ආරවුලකදී අසල්වැසියෙකුගේ පහරකෑමට ලක්ව රෝහල්ගතව සිටින බවත් නුවරඑළිය මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක ප්‍රේමලාල් හෙට්ටිආරච්චි සඳහන් කළේය.

# පෙබරවාරියේ විදුලි ගාස්තු සංශෝධනය වැරැදි දත්ත මත ගත් තීරණයක්



**- උපයෝගීතා කොමිසමේ හිටපු සභාපති ජනක රත්නායක**

■ අශිකා ජයවීර

පෙබරවාරි මස සිදුකළ විදුලි ගාස්තු සංශෝධනය වැරැදි දත්ත මත ගත් තීරණයක් බව වත්මන් විදුලි ගාස්තු අඩුකිරීමෙන් ඔප්පු වන්නේ යැයි මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ හිටපු සභාපති ජනක රත්නායක පැවසීය.

ගාස්තු සංශෝධනය උදෙසා ලංකා විදුලි බල මණ්ඩලය ඉදිරිපත් කරන ඇතැම් දත්ත සාවද්‍ය බවද ඒවා නිසි ලෙස පරීක්ෂා කිරීමෙන් ඒ බව ඔප්පු වන බවද හෙතෙම සඳහන් කළේය.එමෙන්ම එම මාසයේදී ක්‍රියාත්මක කළ ගාස්තු වැඩිකිරීමෙන් බලශක්ති දරිද්‍රතාව ද ඉහළ ගිය බව ඔහු ඊයේ (03 වැනිදා) විශේෂ ප්‍රකාශයක් කරමින් පැවසුවේය.

විදුලි පාරිභෝගිකයන් ලක්ෂ පහකට ආසන්න සංඛ්‍යාවක් විදුලි පරිභෝජනය බිංදුව දක්වා අඩු කර ඇති බවත් මෙවර විදුලි ගාස්තු සංශෝධනයෙන් යම් තාක් දුරට විදුලි පාරිභෝගිකයන්ට සාධාරණයක් ඉටුකර තිබෙන බවත් හිටපු සභාපතිවරයා පැවසුවේය.

ජනක රත්නායක මහතා වැඩිදුරටත් මෙසේද පැවසීය.

"මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නව සභාපති ඇතුළු සාමාජිකයන්ට මා ප්‍රශංසා කරනවා. ඔවුන් කොමිසමේ ස්වාධීනත්වය ආරක්ෂා කරගැනීම සහ පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීම වෙනුවෙන් අඛණ්ඩව පෙනී සිටිනවා.

ජල විදුලියෙන් වාර්ෂිකව ජනනය කරන විදුලි ප්‍රමාණය ගිගා වොට් පැය පන්දහසකට ආසන්නයි. ඒ එක ඒකකයක වියදම රුපියල් පහකට අඩුයි. අඩු පරිභෝජනයක් ඇති ගෘහස්ථ පාරිභෝගිකයන් ලක්ෂ පනහකට ආසන්න සංඛ්‍යාවක් වාර්ෂිකව පරිභෝජනය කරන විදුලි ප්‍රමාණය ගිගා වොට් පැය දෙදහසකට අඩුයි. හතළිස්පන්දහසක් වන ආගමික ස්ථානවල වාර්ෂික විදුලි පරිභෝජනය ගිගා වොට් පැය 90ක් වගේ වෙනවා. ඉතින් මේ සියලු දෙනාට ඉතාමත් අඩු මුදලකට විදුලිය සැපයිය හැකියි. ඒ වගේම කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් සඳහා හැකි තරම් සාධාරණ ගාස්තුවක් ලබාදෙන්න පුළුවන්."

# මහජන ප්‍රදර්ශනය දා පේරාදෙණිය සරසවියේ දේපළ වලට හානි වෙලා නැහැ

## - උපකුලපති මහාචාර්ය එම්.ඩී. ළමාවංශ

පේරාදෙණිය විශ්වවිද්‍යාලය නැරඹීමට අතිවිශාල ජනතාවක් පැමිණියද, විශ්වවිද්‍යාලයේ කිසිදු භෞතික දේපළකට අලාභ හානියක් වී නැතැයි වගකීමෙන් පවසන බව එම විශ්වවිද්‍යාලයයේ උපකුලපති මහාචාර්ය එම්. ඩී. ළමාවංශ සඳහන් කරයි.

වෛද්‍ය පීඨය හා විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ප්‍රවේශ මාර්ගය එකම ස්ථානයක් හරහා වැටී තිබීම හේතුවෙන් එහි යම් තදබදයක් ඇති වී තිබෙන අතර, ඉන් මල් පාත්තියක මල් පැල වලට සිදු වූ හානියක් හැරුණු විට කිසිදු අලාභයක් විශ්වවිද්‍යාලයට සිදුවී නොමැති බවද උපකුලපතිවරයා නිවේදනයක් නිකුත් කරමින් සඳහන් කරයි.



උපකුලපතිවරයා

'පේරාදෙණිය සරසවිය බලා හාලත් ගිහින්' මැයෙන් ඊයේ (03 වැනිදා) දිනපතා 'අරුණ' පුවත්පතේ මුල් පිටුවේ පලවූ පුවත සම්බන්ධව කරුණු පැහැදිලි කරමින් උපකුලපතිවරයා නිකුත් කරන ලද නිවේදනයේ වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලය අසල කුණු දැමීම හා තණ පිට්ටනියක වාහන ගාල් කර තිබූ ඡායාරූප උපුටා දක්වමින් විශ්වවිද්‍යාලයේ දේපළ හෝ විශ්වවිද්‍යාලයේ උද්‍යානයන්ට හානි සිදුව ඇති බව ප්‍රකාශ කළ ද එවැනි කිසිදු අලාභහානියක් සිදුවී නොමැති බවයි.

එම ස්ථානය මෙවැනි විශේෂ උත්සව වලදී රථවාහන නැවැත්වීම සඳහා මීට පෙරද භාවිතා කළ ස්ථානයක් බවද, ලක්ෂ දෙකකට ආසන්න ජනතාවක් විශ්වවිද්‍යාලයට පැමිණියද ඉතා විනයගරුකව කටයුතු කිරීම පිළිබඳ සිය හෘදයාංගම ස්තුතිය එම ජනතාවට පිරිනමන බවද උපකුලපතිවරයා පවසයි.

# ග්‍රහචාරය

**2023 ජූලි 04 වැනි අඟහරුවාදා**

රාහු කාලය
සවස 3.22 - සවස 4.56
රාත්‍රි 3.07 - රාත්‍රි 4.34

ශුභ දිසාව - නැගෙනහිර
මරු සිටින දිසාව - බස්නාහිර

### මේෂ
සිතිවිලි දැඩි වේ

ආවේගශීලී ගතිගුණ පාලනය කරගනිමින් තිහඬ බවක් පෙන්වමින් සිටීමට උනන්දු වන මුත් අන්‍යයන් ඉදිරියේ එහි වෙනස්වීම් ඇතිවේ. සිතිවිලි දැඩි වේ. කරන දේවල්වලට ඔබ්බෙන් වූ මෘදු හැඟීම් ඇතිවේ. අන්‍යයන් හා සුහදත්වයට කැමැති වේ.

### වෘෂභ
තරගකාරී හැඟීම්

තමන්ගේ හැකියාවට ඔබ්බෙන් තරගකාරී හැඟීම් ඇතිවීම ගැටලුවලට හේතු ඇති කරනු ඇත. සවස් කාලයේදී සිතිවිලි පාලනය කරගැනීමට හැකිවේ. සුහද හැඟීම්වලට ඉඩ ලැබේ. කතාබහ පාලනය කරගත යුතු වේ.

### මිථුන
ආදායම් යහපත්

හිතේ ධෛර්යය හා උනන්දුව වඩාත් පොතපත හැදෑරීම් වෙනුවෙන් යොමු වේ. ආගමික කටයුතු සඳහා අන්‍යයන් හා මුසුවීමේ ඉඩකඩ පවතී. සුළු වශයෙන් වුවත් ආදායම් තත්ත්වය යහපත් වේ.

### කටක
ගේදොර ගැටලු

සවස් කාලය වඩාත් යහපත් වේ. උදේ දක්වා පැවැති මානසික අවහිරතා බොහෝ දුරට මගහැරේ. කෙළිලොල් හෝ විනෝදාත්මක කටයුතුවලට ඉඩ ඇතත් ඉන් ගේදොර ගැටලු ඇති කළ හැකිය.

### සිංහ
අන්‍යයන්ගේ සහාය

තමන්ගේ කටයුතු කරගැනීමට හැකියාව හා උනන්දුව පවතින අතර ඉන් හොඳ ප්‍රතිඵල ලැබීමේ ඉඩකඩද පවතී. සවස් කාලය තරමක් කරදර අවස්ථාවන්ට මුහුණ පෑමට සිදුවිය හැක. බරපතළ නොවේ. අන්‍යයන්ගේ සහාය ලැබීමකටද ඉඩ ඇත.

### කන්‍යා
ජලය සම්බන්ධ ගැටලු

ශාස්ත්‍රීය කටයුතු කෙරේ උනන්දුව තවදුරටත් පවතී. කථනය, ගායනය සම්බන්ධ තේරීම් කටයුතුවලදී බාධක මතුවීමට පුළුවන. සවස් කාලය ජලය සම්බන්ධ ගැටලු ඇති කරවිය හැකිය. විවෘත විලාස කටයුතු පාලනය කරගන්න.

### තුලා
සහනශීලී දවසකි

කාර්යබහුල වුවද ප්‍රතිලාභ මඳ වේ. රස ආහාර, රූපලාවණ්‍ය කටයුතුවලදී විශේෂයි. සවස් කාලය වනවිට මානසික වශයෙන් සුළු සහනශීලී තත්ත්වයක් ඇති කළ හැකිය. ගේදොර කටයුතු ගැන උනන්දුවක් පෙනේ.

### වෘශ්චික
කාර්යබහුලය

එහෙත් මානසික වියවුල් බව හැකි තරම් පාලනය කරගන්න. කාර්යබහුල බවක් ඇතිවේ. ව්‍යාපාර කටයුතු සඳහා උදේ කාලය හැකි තරම් යොදගන්න. විශේෂයෙන් අයකර ගැනීම් සම්බන්ධයෙනි.

### ධනු
සෘජු තීරණ

කුමන ව්‍යාකූල තත්ත්වයන් යටතේ වුව සෘජුව හා නිරවුල්ව කටයුතු කිරීමට උත්සාහ ගනු ඇත. ව්‍යාපාර කතාබහට සවස් කාලය වඩාත් ගැළපේ. එහෙත් බද්ධ හෝ පාර්ශ්වීය (හවුල්) ව්‍යාපාර සඳහා එකඟ වීම දුෂ්කර වනු ඇත. ශුභ දිනයකි.

### මකර
නිරවුල් සිතිවිලි

එදිනෙද කටයුතු පිළිබඳ කතාබස් කිරීමේදී පෙර සූදානම අත්‍යවශ්‍ය වේ. අනපේක්ෂිත සංකීර්ණ තත්ත්වයන් ඇතිකළ හැකිය. සවස් කාලයේදී වඩාත් නිරවුල් සිතිවිලි ඇතිවීමට පුළුවන.

### කුම්භ
හවුල් අවුල්

වගකීම් දරන අය වඩාත් තම කටයුතු සංවිධානය ගැන හොඳ වැටහීමක් තිබිය යුතු වේ. උදේ කාලය ගනුදෙනුකරුවන් හා සබඳතාවන්ට යහපත් වේ. හවුලේ කටයුතු ආරම්භයකට සුබ මඳ වේ.

### මීන
සිතේ පාලනයක්

ආගමික කටයුතු හා මැදිවූ සබඳතාවන්ට වඩාත් සුබ බවක් පෙනේ. රැකියාව හා ආදායම් සම්බන්ධ ගැටලු විසඳීමට හෝ මැදිහත් වීමට උදේ කාලය වඩාත් ගැළපේ. සිතේ මනා පාලනයක් ඇතිවේ.







වටවල නිවසකට හානිවී තිබෙන අයුරු

# තැන තැන මහ වැසි

# කර ඇති අනතුරු



ගාමිණීපුර නිවසක් මතට පස් කන්දක් කඩාවැටී

■ සාලිය කුමාර ගුණසේකර
■ සිතාර ඉරාෂ් - වටවල
■ ආර්. එම්. එෆ්. සුහෙල් - නුවරඑළිය
■ මනුර සුදත් සෙල්ලහේවා - හැටන්

අධික වැසි තත්ත්වය හේතුවෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය දිස්ත්‍රික්ක තුනක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුනකට නායයෑමේ අවදානම් නිවේදන නිකුත් කර ඇත. ඒ අනුව, නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව, මහනුවර දිස්ත්‍රික්කයේ පස්බාගේ කෝරලය සහ රත්නපුර දිස්ත්‍රික්කයේ නිවිතිගල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට මෙම නිවේදන නිකුත් කර ඇතැයි ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ ආචාර්ය වසන්ත සේනාධීර පැවැසුවේය.

අධික වැසි තත්ත්වයත් සමග ඉහළ කොත්මලේ ජලාශයේ වාන් දොරටු දෙකක් විවෘත කර ඇතැයි ජලාශය භාර ඉංජිනේරුවෝ කියා සිටිති. එමෙන්ම කාසල්රී ජලාශයේ ජල මට්ටමද ඉහළ යමින් පවතින බව වාර්තා වේ. හැටන්, ගාමිණීපුර ප්‍රදේශයේ නිවසක් මතට පස් කන්දක් කඩා වැටීමෙන් එම නිවසේ මුළුතැන්ගෙයට දැඩි හානිවී ඇත. වටවල ප්‍රදේශයේද නිවසක් මතට පස් කන්දක් කඩා වැටී තිබිණි.

නුවරඑළිය තලවක්කල ප්‍රධාන මාර්ගයේ නානුඔය ක්ලැරෙන්ඩන් ප්‍රදේශයේදී මාර්ගයට පස් කන්දක් කඩා වැටීම හේතුවෙන් එම මාර්ගයේ ගමනාගමනයට ඊයේ (03 වැනිදා) බාධා එල්ල විය. බස්නාහිර, සබරගමුව, මධ්‍යම සහ වයඹ පළාත්වලත් ගාල්ල, මාතර දිස්ත්‍රික්කවලත් අද (04 වැනිදා) දිනයේ වැසි ඇතිවන බවද සබරගමුව පළාතේත්, මහනුවර, නුවරඑළිය යන දිස්ත්‍රික්කවල ඇතැම් ස්ථානවලට මිලි මීටර් 150 ඉක්මවූ තද වැසි ඇතිවිය හැකි බවත් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව කියයි.



ඉහළ කොත්මලේ ජලාශය

එමෙන්ම, බස්නාහිර පළාතෙත්, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල ඇතැම් ස්ථානවලට මිලි මීටර් 75 ඉක්මවූ වැසි ඇතිවිය හැකියි. මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුම් ප්‍රදේශවලත්, උතුරු මැද පළාතේත්, පුත්තලම, හම්බන්තොට සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවලත් විටින් විට පැයට කිලෝමීටර් 40ත් 45ත් අතර තද සුළං ඇතිවිය හැකි බවත් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

ඊයේ (03 වැනිදා) පෙරවරු 8.30න් අවසන් වූ පැය 24ක කාලය තුළදී දිවයිනේ වැඩිම වර්ෂාපතනය වාර්තා වූයේ ලක්ෂපාන ප්‍රදේශයෙනි. එම ප්‍රදේශයෙන් මිලි මීටර් 157ක වර්ෂාපතනයක් වාර්තා විය. දිවයිනේ නිරිත දිග කොටසේ වැසි තත්ත්වය තවදුරටත් වැඩිවිය හැකි බවද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව කියයි.

# මිනී අළු තැන්පත්කර හදන ස්වර්ණාභරණවලට ලෝකයේ ඉහළ ඉල්ලුමක්

■ නිර්මාණි තිලකසිරි

මියගිය පුද්ගලයන්ගේ භෂ්මාවශේෂ තැන්පත් කර මෙරට දී නිෂ්පාදනය කරන ස්වර්ණාභරණ හරහා වසරකට ඩොලර් ලක්ෂ පහළොවක පමණ විදේශ විනිමයක් ඉපයීමේ හැකියාව ලැබී ඇති බව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සඳහන් කරයි. මේ වනවිටත් මෙරට තුළ ආර්.කේ.එස්. අපනයන ආයතනය හරහා භෂ්මාවශේෂ ස්වර්ණාභරණ නිර්මාණ කටයුතු සිදුවන අතර ඔවුන්ගේ එම නිෂ්පාදන සඳහා ඉහළ ඉල්ලුමක් නිර්මාණය වී තිබේ.

ලංකාව තුළ තවමත් මෙවැනි ස්වර්ණාභරණ පැළඳීම සඳහා නැඹුරුවක් දක්වන පිරිසක් දක්නට නොලැබෙන නමුත් යුරෝපය, ජර්මනිය, මැද පෙරදිග වැනි රටවල් තුළ මෙම ආභරණ සඳහා විශාල ඉල්ලුමක් නිර්මාණය වී ඇත. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් මෙම නිෂ්පාදන කිරීම සඳහා අදාළ ආයතන වෙත මේ වන විටත් සියලු පහසුකම් සලසා දී ඇත. මෙම ස්වර්ණාභරණවල පවතින ඉහළ ප්‍රමිතිය හේතුවෙන් ලැබෙන ඇනවුම් ප්‍රමාණය ඉහළ යමින් ඇති බව ආර්.කේ.එස්. ආයතනයේ සභාපති රෝලන්ඩ් කාල් පොයිබර් සඳහන් කරයි.

# පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු 4ක් පත් කෙරේ

■ නිලන්ත මදුරාවල

සබරගමුව, ඌව, උතුරු සහ නැගෙනහිර යන පළාත් සඳහා නව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් පත් කරනු ලැබ ඇත. සබරගමුව පළාතේ නව අධ්‍යක්ෂවරයා ලෙස පත්ව සිටින්නේ මහනුවර කිංස්වුඩ් විදුහලේ විදුහල්පති උපාලි චන්ද්‍රකීර්තිය. ඌව පළාතේ නව අධ්‍යක්ෂවරයා ලෙස පත් කර ඇත්තේ කෑගල්ල විද්‍යාලයේ විදුහල්පති එන්. ඒ. ඩී. ආර්. හේමන්තය. උතුරු පළාතේ වැඩබලන පළාත් අධ්‍යක්ෂවරයා වන ජෝන් පින්ටො එම තනතුරේ ස්ථිර කෙරෙන අතර නැගෙනහිර පළාතට පත් වන්නේද දැනට එම තනතුරේ වැඩ බලන එම්. කනගසූරියන්ය. මෙම සිව් දෙනාට රාජ්‍ය සේවා කොමිෂන් සභා අධ්‍යාපන සේවා කමිටුවේ අනුමැතිය ලැබී තිබේ.

බස්නාහිර, වයඹ, දකුණ සහ උතුරු මැද යන පළාත්වල පළාත් අධ්‍යක්ෂ තනතුරු මේ වනවිට පුරප්පාඩුව පවතින නමුත් ඒවායේ ආණ්ඩුකාරවරු පවසන්නේ පළාත් අධ්‍යක්ෂ තනතුරු පිරවීමේ බලය ඇත්තේ පළාතට බවය. ඒ අනුව එම පළාත් මගින් වෙන වෙනම අයැදුම්පත් කැඳවා එම තනතුරු සඳහා සුදුස්සන් පත් කිරීමට නියමිතය. අධ්‍යාපන පරිපාලන සේවයේ පළමු ශ්‍රේණියේ නිලධාරියෙක් පළාත් අධ්‍යක්ෂ තනතුරට පත් කළ යුතු වන අතර එම සේවය දීප ව්‍යාප්ත සේවාවකි. එහෙත් ඉහත පළාත් හතරේ අධ්‍යක්ෂ ධුර සඳහා පිට පළාත්වල එම සේවයේ නිලධාරීන්ට පත් වීමට ඇති ඉඩකඩ අවම තත්ත්වයක පවතී.

# පේරාදෙණිය පොලිස් ස්ථානාධිපතිට මහජන විරෝධයක්



ගල්ඔය විහාරස්ථානයේ පැවැත් වූ රැස්වීම

■ සුරංග රාජනායක - ගම්පොළ

පේරාදෙණිය, ගල්ඔය ප්‍රදේශයේ මහා පරිමාණයෙන් පවත්වාගෙන යන මත්ද්‍රව්‍ය ජාවාරම නවතා දෙන ලෙස ඉල්ලා ගල්ඔය විහාරස්ථානයේ පැවැත් වූ රැස්වීමට සහභාගි වී සිටි මාධ්‍යවේදීන් ඉන් පලවා හැරීමට උත්සාහ කළ පේරාදෙණිය පොලිසියේ ස්ථානාධිපතිවරයා ඇතුළු පොලිස් නිලධාරින්ට ගම්වාසීහු දැඩි විරෝධය පළ කළහ.

මෙම ප්‍රදේශයේ වසර ගණනාවක සිට පවත්වාගෙන යන මත්ද්‍රව්‍ය ජාවාරම මහනුවර, ගම්පොළ, පේරාදෙණිය, නාවලපිටිය, ගලහා ඇතුළු නගර රැසකට හා වතුකරයට බෙදා හරින බවත් මෙම හේතුව නිසා එම ප්‍රදේශවල හොරකම් ඇතුළු අපරාධ ඉහළ ගොස් ඇති බවත් ගම්වාසීහු චෝදනා කරති.

මෙම මත්ද්‍රව්‍ය ජාවාරම හේතුවෙන් එම ගම්මානයේදී තිදෙනකු ඝාතනයට ලක්ව ඇති බවත් විශාල පිරිසක් කැපුම් කෙටුම්වලට ලක්ව ඇති බවත් ඔවුහු චෝදනා කරති. මෙම රැස්වීම ගල්ඔය තුම්බෝධිමළු විහාරයේ ධර්ම ශාලාවේ දී පැවැත් වූ අතර ගම්වාසීන්ගේ ආරාධනයෙන් මාධ්‍යවේදීහුද ඒ සඳහා සහභාගී වී සිටියහ.

කෙසේ වෙතත් පේරාදෙණිය පොලිස් ස්ථානාධිපතිවරයාට එල්ල වූ විරෝධයත් සමග ඔහු ඇතුළු නිලධාරීහු රැස්වීමට නොයා ජීප් රථයටම වී සිටියහ.

# උදලු තලයකින් ජනේලය ඇර මුදල් හා රන් භාණ්ඩ සොරාගෙන

■ බිමල් ජයසිංහ - බණ්ඩාරගම

බණ්ඩාරගම, කඹුරුගොඩ ව්‍යාපාරිකයකුගේ නිවසේ ජනේලය උදලු තලයකින් විවෘත කර ඊට ඇතුළු වී රුපියල් ලක්ෂ 6කට ආසන්න මුදල් සහ රන් ආභරණ සොරාගත් පුද්ගලයන් සොයා බණ්ඩාරගම පොලිසිය විමර්ශනයක් ආරම්භ කර ඇත. සොරා ගත් රන් භාණ්ඩ අතර පංචායුධ, මුදු සහ රන්මාල වන බවත් ඊට අමතරව කැට තුනක යොද තිබූ මාරු කාසිද වේ.

අදාළ ව්‍යාපාරිකයා තම බිරිඳගේ මවගේ උපන් දිනයට සහභාගිවීම සඳහා ඇයගේ නිවසට ගොස් එදිනම රාත්‍රී දහයට පමණ පැමිණ නින්දට ගොස් තිබූ බව පොලිසිය සඳහන් කරයි. ව්‍යාපාරිකයාගේ බිරිඳ පසුදින උදෑසන අවදි වී මේසය අසල සිටියදී එහි මාරු කාසි පුරවා තිබූ කැට කපා මුදල් කිසිවකු හෝ රැගෙන ඇති බවට ව්‍යාපාරික සැමියාට පවසා තිබූ බව පොලිසිය කියයි.

# බෝට්ටුව පෙරළී ධීවරයන් දෙදෙනකු පැය 5ක් මුහුද මැද සටනක



ධීවරයන් දෙදෙනා

■ නුවන් ජයසේකර - මීගහජඳුර

මුහුද මැද බෝට්ටුවක් පෙරළී පැය පහකට අධික කාලයක් ජීවිතයත් මරණයත් අතර සටනක යෙදි සිටි ධීවරයන් දෙදෙනෙකුගේ දිවි ගලවා ගැනීමට මිරිස්සෙන් මුහුදු ගිය ධීවරයන් පිරිසක් කටයුතු කළ පුවතක් තංගල්ලෙන් වාර්තා වේ.

තංගල්ල පරාක්‍රම පාරේ පදිංචි ඒ. ඒ. චමිල් රොෂාන් ප්‍රියන්තට අයත් එක් දින යාත්‍රාවකින් මසුන් ඇල්ලීම සඳහා තංගල්ල පදිංචි 48 හැවිරිදි ජේ.ඒ. ප්‍රදීප් ප්‍රියන්ත හා 40 හැවිරිදි චමින්ද කුමාර තංගල්ල ධීවර වරායෙන් මුහුදු ගියේ පසුගිය 29 වැනි දින දහවල් 2.30ට පමණය. එලෙස මුහුදු ගිය ධීවර යාත්‍රාව කාර්මික දෝෂයකට ලක්ව මුහුද මැද නතරව තිබියදී දියවැලකට හසුව පෙරළී ගොස් අනතුරට පත්ව තිබුණේ ධීවරයන් දෙදෙනාවද මුහුදේ ගිල්ලවමිනි.

කෙසේ වෙතත් පෙරළී ගිය බෝට්ටුවේ එල්ලී පැය පහකට අධික කාලයක් කිසිවෙකුගේ සහායක් හෝ සහෝදර බෝට්ටුවක් එනතෙක් මහ මුහුද සමග ඔට්ටු වෙන්නට දෙදෙනාට සිදුව ඇත.

එලෙස සිටින අවස්ථාවේ පාන්දර 6.30ට පමණ මිරිස්සෙන් මුහුදු ගිය වික්‍රම 02 බහුදින යාත්‍රාව ගොඩ බිම බලා එමින් සිටියදී මෙම පිරිස මුහුදේ පාවෙමින් සිටිනු දැක වහාම එම ස්ථානයට ගොස් ඔවුන්ගේ දිවි ගලවා ගැනීමට සමත්ව තිබිණි.

# ඇමරිකානු රැකියා පෙන්නා මුදල් වංචා කළ සැකකරු සොයා විමර්ශන

■ අශිකා ජයවීර

"ජයභූමි පදනම" නමින් ව්‍යාජ විදේශ රැකියා නියෝජිතායතනයක් පවත්වාගෙන යමින් ඇමරිකාවේ මියාමි නගරයේ වරාය ව්‍යාපෘතියක රැකියා ලබාදෙන බව පවසා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරියන් මාර්ගයෙන් දිවයිනේ විවිධ ප්‍රදේශවල පදිංචි තරුණ තරුණියන් රැසකගෙන් වංචනික ලෙස මුදල් අය කළ මහා පරිමාණ ජාවාරමක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විශේෂ විමර්ශන අංශයට තොරතුරු වාර්තා වී ඇත. ඒ අනුව ක්‍රියාත්මක වූ කාර්යාංශ නිලධාරීන් රාජගිරිය ප්‍රදේශයේ මෙලෙස වංචනික අයුරින් පවත්වාගෙන යනු ලැබූ ආයතනය වටලා කරුණු අනාවරණය කරගෙන තිබේ.

එහිදී නිලධාරීන් කළ පරීක්ෂාවේදී රැකියා අපේක්ෂිතයින් 636 දෙනෙකුට අදළ ලිපිගොනු කාර්යාංශ විමර්ශන කටයුතු භාරයට ගෙන ඇත. මෙහිදී සිදුකළ වැඩිදුර විමර්ශන අනුව ප්‍රධාන සැකකරු හඳුනාගෙන ඇති අතර වසර 3කට අධික කාලයක් තිස්සේ මෙම ජාවාරම මෙහෙයවා ඇති බව අනාවරණය වී ඇත. එමෙන්ම සැකකරු විසින් ඇමරිකාවේ වීසා අයැදුම් කිරීම සඳහා පුද්ගලයන් 400ක ගෙන් පමණ එක් අයැදුම්කරුවෙකුගෙන් රුපියල් හත්ලක්ෂ පනස්දහසක් බැගින් වූ මුදලක් අයකර ගෙන ඇති බව වාර්තා වී තිබේ.

මෙම නීති විරෝධී ක්‍රියාවට අදළව කාර්යාංශය මගහරිමින් සිටින සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා විමර්ශන නිලධාරීහු කටයුතු කරමින් සිටිති. මෙම වැටලීම සම්බන්ධයෙන් මේ වනවිට කොළඹ, අලුත්කඩේ අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇත.

# ත්‍රිපෝෂ යළි නිපදවන තෙක් දරුවන්ට බිත්තර දෙන්න

## - පවුල් සෞඛ්‍ය සේවා සංගමය

■ වරුණි පෙරමුණ

ත්‍රිපෝෂ නිෂ්පාදනය යථා තත්ත්වයට පත්වන තෙක් මාස හයත් අවුරුදු තුනත් අතර දරුවන්ට බිත්තර හෝ වෙනත් ධාන්‍ය වර්ගයක් විකල්ප ආහාරයක් ලෙස ලබාදෙන ලෙස රජයේ පවුල් සෞඛ්‍ය සේවා සංගමය රජයෙන් ඉල්ලා සිටියි. එම සංගමයේ සභාපතිනී දේවිකා කොඩිතුවක්කු ප්‍රකාශ කළේ මේ වනවිට මාස හයේ සිට අවුරුදු තුන දක්වා වයස දරුවන්ට ත්‍රිපෝෂ ලබාදීම වසරක පමණ කාලයක් සිට ඇනහිට ඇති බවය. මෙය දරුවන්ගේ වර්ධනයට බාධාවක් වන නිසා ත්‍රිපෝෂ ලබාදෙන තුරු එම දරුවන්ට විකල්ප ආහාරයක් ලෙස බිත්තර, ධාන්‍ය වර්ගයක්, වෙනත් පෝෂ්‍යදායි ආහාරයක් ලබාදීම වැදගත් බව සභාපතිනිය අවධාරණය කළාය.

ළමුන්ට ලබා දෙන ත්‍රිපෝෂ සෑදීම සඳහා සුදුසු බඩඉරිඟු සොයා ගැනීමට නොහැකි වීම මත මෙසේ කුඩා ළදරුවන්ට ලබා දෙන ත්‍රිපෝෂ සෑදීමට නොහැකි වී ඇති බව ත්‍රිපෝෂ සමාගම සඳහන් කරයි.

මෙරට පවතින බඩඉරිඟු තොග ළමුන්ට ත්‍රිපෝෂ සෑදීම සඳහා ලබාගැනීමට තරම් සුදුසු ප්‍රමිතියන් නොවන බවද එම සමාගම සඳහන් කරයි.



# විජයදාස ඉන්දියාවේ සර්ව ආගමික සමුළුවකට

ඉන්දියාවේ මධ්‍ය ප්‍රදේශයේ බෙට්‍රල් අම්ලා නගරයේ පැවැති සර්ව ආගමික සමුළුව සහ ජාත්‍යන්තර සාම සම්මාන උත්සවයේ ප්‍රධාන දේශනය කිරීමට ගිය අධිකරණ ඇමැති ආචාර්ය විජයදාස රාජපක්ෂ ඊට සහභාගි වූ අවස්ථාව.

# මැණික් එබ්බවූ රන් ආභරණ සහ දියමන්ති අපනයනය 32%කින් ඉහළට

- මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය



සුනිල් රූපසිංහ - පල්ලේපොළ

මැණික් අගය එකතු කළ රන් ආභරණ සහ දියමන්ති අපනයනය සියයට තිස් දෙක(32%)කින් ඉහළ ගෙස් ඇතැයි ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සඳහන් කරයි.

මෙම වසරේ මැයි මාසය දක්වා කාලයේදී එමගින් ඇමරිකානු ඩොලර් මිලියන 222ක් උපයා ගෙන තිබේ. එය පෙර වසරේ අදාළ කාල සීමාවට සාපේක්ෂව ඇමරිකානු ඩොලර් මිලියන 61ක වැඩිවීමක් බවද එම අධිකාරිය පැවැසීය.

එහි සභාපති විරාජ් ද සිල්වාගෙන් 'අරුණ' කළ විමසීමේදී ඔහු පැවැසුවේ 2022 වසරේ මැයි මාසය දක්වා කාලයේදී ඉන් ලබා ගෙන තිබූ ආදයම ඇමරිකානු ඩොලර් මිලියන 161ක් බවයි.

මෙරට මැණික් අගය එකතු කළ රන් ආභරණ සහ දිමයන්ති වැඩි වශයෙන් ලබාගන්නේ ඇමරිකාව විසිනි. ඊට අමතරව තායිලන්තය, චීනය සහ හොංකොං ඇතුළු රටවල් කිහිපයක් සඳහා ද එම නිෂ්පාදන අපනයනය කෙරෙන බව සභාපතිවරයා කීවේය.

නිල් හා රතු ආරනූල්, ඔප දැමූ ගෙවුඩ ඇතුළු මැණික් සඳහා ජාත්‍යන්තර වෙළෙඳපලේ ඉහළ ඉල්ලුමක් පවතී.

මැණික්, රන් ආභරණ සහ දිමයන්ති අපනයනයෙන් මෙම වසරේදී අපේක්ෂිත ආදයම ඇමරිකානු ඩොලර් මිලියන දහසක් බවත් ඒ සඳහා වන ඉල්ලුම සැපිරීම උදෙසා නිෂ්පාදනකයන්, ගැණුම්කරුවන් සහ කර්මාන්තකරුවන් නව තාක්ෂණයෙන් සවි බල ගැන්වීමට පියවර ගෙන තිබෙන බවත් හෙතෙම පැවැසීය.

# මුහුදු කූඩැල්ලන් හා මෝර වරල් රට පටවන්න හදලා

## බෝට්ටුවෙන් බීඩි කොළ ගෙනා අයකුත් අහුවෙයි



මුහුදු කූඩැල්ලන් හා මෝර වරල්

ජුඩ් සමන්ත - පුත්තලම

ඉන්දියාවට යැවීමට සූදනම් කර තිබූ මුහුදු කූඩැල්ලන්, මෝර වරල් තොගයක් සහ ඉන්දියාවේ සිට මෙරටට ගෙන එමින් තිබූ බීඩි කොළ තොගයක් සමග සැකකරුවන් දෙදෙනකු පොලිසිය සහ නාවුක හමුදව විසින් කල්පිටියේදී අත්අඩංගුවට ගෙන ඇත.

මුහුදු කූඩැල්ලන් සහ මෝර වරල් තොගය කල්පිටිය ඒත්තාලේ ප්‍රදේශයේ දී කල්පිටිය පොලිසිය විසින් තම භාරයට ගෙන තිබේ. ඒවා සඟවා තබා ගෙන සිටි අයකු ද සැකපිට අත්අඩංගුවට ගෙන ඇත.

පොලිස් විශේෂ කාර්යාංශයේ කල්පිටිය ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් අනුව පෙරේද (02 වැනිද) එම වැටලීම සිදු කර තිබේ.

ඝණජිෆෝම් පෙට්ටිවල බහා තිබූ මුහුදු කූඩැල්ලන් කිලෝ ග්‍රෑම් 500ක් පමණ සහ මෝර වරල් කිලෝ ග්‍රෑම් 200ක් පමණ මෙහිදී පොලිස් භාරයට ගෙන ඇත. ඒවා මුහුදු මාර්ගය ඔස්සේ ඉන්දියාවට රැගෙන යාමට සූදනම් කර තිබූ බව අත්අඩංගුවට ගත් සැකකරු පවසා තිබේ.

මේ අතර, පොලිතින් උර 65ක අසුරා බෝට්ටුවකින් රැගෙන යමින් තිබූ බීඩි කොළ කිලෝ ග්‍රෑම් 1947ක් කල්පිටිය කලපුවේදී සිය භාරයට ගෙන ඇති නාවුක හමුදව සැකකරුවකුව ද අත්අඩංගුවට ගෙන ඇත. එලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ වනාතවිල්ලුව, කරතිව් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

ඉන්දියාවේ සිට මුහුදු මාර්ගය ඔස්සේ ගෙනවිත් ඇති බීඩි කොළ තොගය ගොඩබිම කරා රැගෙන යමින් සිටි අතරතුර නාවුක හමුදවේ කල්පිටිය විජය කඳවුරේ නිලධාරීන් විසින් සිය භාරයට ගෙන ඇත.

එම සැකකරු සහ බීඩි කොළ තොගය කල්පිටිය පොලිසියට භාර දී තිබේ.

# උපන් දිනය සමරන්න 'ටිනර්' වලින් නහවලා

එච්.එල්. සුනිල් ශාන්ත - මොරොන්තුඩුව

ඉංගිරියේ ව්‍යාපාරික ස්ථානයක පසුගියද පැවැති උපන් දින සාදයකදී මිතුරන් විසින් උපන්දිනය සැමරූ පුද්ගලයා 'ටිනර්' වලින් නහවා ඇතැයි පැවසේ. එම ව්‍යාපාරික ස්ථානයේ සේවකයකුගේ උපන් දිනය නිමිත්තෙන් ඔහුගේ සහෝදර සේවකයන් විසින් අදළ උත්සවය සංවිධානය කර තිබේ. එහිදී සේවකයන් කිහිපදෙනකු එක්ව උපන් දිනය සැමරූ මිත්‍රයා අල්ලාගෙන සඟවා තිබූ වතුර බෝතල් වලින් ඔහු නහවා ඇත. ඒ අතර සිටි ඔහුගේ හොඳම මිත්‍රයාට හසුව ඇත්තේ 'ටිනර්' පිරවූ බෝතලයකි. ඔහු එයින් තම මිත්‍රයා නහවා ඇත්තේ එය වතුර බෝතලයක් යැයි වරදවා වටහාගෙනය. පසුව උපන් දිනය සැමරූ පුද්ගලයාගේ ඇස් දැවිල්ල ඇතිවීමත්, ටිනර් සුවඳ වහනය වීමත් සමග ඔවුන්ට සිදුව ඇති දෑ වැටහී තිබේ. එසැණින් මිතුරන් විසින් ඔහු ඉංගිරිය රෝහලට රැගෙන ගොස් ඇත. ඔහුගේ තත්ත්වය බරපතළ නොවූ හෙයින් ප්‍රතිකාර ලබා පිටව ගොස් ඇතැයි රෝහල් ආරංචි මාර්ග සඳහන් කළේය.


විශේෂ ධන යෝග හඳහන
Handahana රාශි සුබ පලන්

විශේෂ දිනුම් ඇදීම

ජූනි 30 දිනුම් අදින ලද විශේෂ හඳහන 470 වෙනි වාරය

මෙවර දිනා ඇති මුළු මුදල
රු. 44,064,640.00

ලග්නය (විශේෂිත) ධනු ජය අංක 06 35 44 57

500,000 ප්‍රථම ත්‍යාගලාභීන් 7ක්

අලෙවි නියෝජිතවරු:

1. කනිවිලගේ රූපසේන මහතා - කරන්දෙනිය
2. W.A. චන්ද්‍රපාල මහතා - මහව
3. P. ප්‍රදීපන් මහතා - මඩකලපුව
4. P.H. චන්ද්‍රපාල මහතා - බලංගොඩ
5. A.A. චූලරත්න මහතා - තෙලඟපාත
6. W.D. විජයරත්න මහතා - වැලිමඩ
7. P. ප්‍රදීපන් මහතා - මඩකලපුව

දෙලක්ෂපති වාසනා අංක ගැලපීමෙන් දෙලක්ෂපතියන් 10ක්

දිනුම් අංක

0 5 0 8 7 6 3 W.M. සරත් ප්‍රියන්ත පෙරේරා මහතා - කඩුගන්නාව
1 1 4 8 0 5 2 N.A.K. බන්දුල මහතා - මීරිගම
0 4 7 7 8 1 7 M.H. දිසානායක මහත්මිය - පේරාදෙණිය
1 1 6 0 6 6 9 අමිල ජයමාන්න මහතා - ජාඇල
1 2 0 8 0 6 5 W.D. නිලන්ති මහත්මිය - මාකවිට
1 6 3 7 5 9 3 K.A. උපුල් මහතා | රත්මලාන
1 5 5 6 5 2 3 ගම්පහ දිස්ත්‍රික්කය
0 3 4 2 2 5 6 G. ක්‍රිෂ්ණකුමාර් මහතා | කිලිනොච්චිය
1 7 5 8 1 7 2 කොළඹ දිස්ත්‍රික්කය
1 1 2 5 6 8 6 සුනිල් ශාන්ත මහතා | B.P. හන්දිය

ලක්ෂපති වාසනා අංකය 8 3 6 4 8

ලක්ෂයේ ජයග්‍රාහක ලොතරැයිපත් අලෙවි කළ දිස්ත්‍රික්ක (ජයග්‍රාහකයින් 36ක්)

- අනුරාධපුර දිස්ත්‍රික්කය 02
- බදුල්ල දිස්ත්‍රික්කය 01
- කොළඹ දිස්ත්‍රික්කය 09
- ගාල්ල දිස්ත්‍රික්කය 02
- ගම්පහ දිස්ත්‍රික්කය 02
- හම්බන්තොට දිස්ත්‍රික්කය 01
- යාපනය දිස්ත්‍රික්කය 04
- කළුතර දිස්ත්‍රික්කය 02
- නුවර දිස්ත්‍රික්කය 01
- කුරුණෑගල දිස්ත්‍රික්කය 02
- මාතර දිස්ත්‍රික්කය 02
- මොණරාගල දිස්ත්‍රික්කය 01
- නුවරඑළිය දිස්ත්‍රික්කය 01
- පොළොන්නරුව දිස්ත්‍රික්කය 01
- පුත්තලම දිස්ත්‍රික්කය 02
- රත්නපුර දිස්ත්‍රික්කය 03

NLB ජාතික ලොතරැයිය
ජීවිතයේ සිහිනයට - වාසනාවේ ආශිර්වාදය



# වාහන වෙන්දේසිය - කොට්ටාව

| වාහන අංකය | නිෂ්පාදන ආ. | මාදිලිය | වාහන අංකය | නිෂ්පාදන ආ. | මාදිලිය |
|---|---|---|---|---|---|
| WP BFV-11XX | හොන්ඩා | DIO | WP BIL-95XX | යමහා | RAY ZR |
| WP BIH-11XX | හොන්ඩා | DIO | WP BFM-27XX | යමහා | RAY ZR |
| SP BFW-14XX | හොන්ඩා | DIO | WP BIP-99XX | යමහා | MT-15 |
| WP BFL-05XX | හොන්ඩා | DIO | WP BDX-58XX | යමහා | FZ - S |
| WP BHW-80XX | හොන්ඩා | DIO | WP BAS-55XX | යමහා | FZ S |
| WP BEF-40XX | හොන්ඩා | DIO | WP BGF-55XX | යමහා | RAY ZR |
| UP BBY-30XX | හොන්ඩා | DIO | CP BIK-44XX | යමහා | FZ-VER 2.0 |
| WP BGY-86XX | හොන්ඩා | DIO | WP BIO-58XX | යමහා | RAY ZR |
| WP BGN-91XX | හොන්ඩා | DIO | WP BFZ-46XX | යමහා | RAY ZR |
| WP BEZ-55XX | හොන්ඩා | DIO | UP BHE-89XX | යමහා | FZ |
| WP BGT-28XX | හොන්ඩා | DIO | WP BHE-03XX | යමහා | FZ VER 2.0 |
| SG BFI-13XX | හොන්ඩා | DIO | NC BDY-66XX | යමහා | FZ S |
| NW BIH-35XX | හොන්ඩා | DIO | WP BDD-37XX | යමහා | FZ S |
| SGBIP61XX | හොන්ඩා | DIO | CP BBH-82XX | බජාජ් | PULSER |
| WP BFF-77XX | හොන්ඩා | DIO | SG BDZ-73XX | බජාජ් | PULSAR NS 200 |
| WP BED-60XX | හොන්ඩා | DIO | WP BFV-30XX | බජාජ් | PULSAR NS 200 |
| WP BHL 19XX | හොන්ඩා | DIO | WP BDL-56XX | බජාජ් | PULSAR |
| WP BHX 21XX | හොන්ඩා | DIO | WP BDE-53XX | බජාජ් | CT 100 |
| UP BHA 86XX | හොන්ඩා | DIO | WP BAL-66XX | බජාජ් | DISCOVER DTS-SI 100 |
| WP BIA-14XX | හොන්ඩා | DIO | CP BAG-67XX | බජාජ් | PULSAR 150CC |
| WP BEU-56XX | හොන්ඩා | DIO | NC BDL-52XX | බජාජ් | PULSAR 180 |
| SG-BIR-62XX | හොන්ඩා | DIO | WP BIW-99XX | TVS | NTORQ |
| WP BHW-68XX | හොන්ඩා | DIO | NW BCM-51XX | TVS | METRO |
| WP BHJ-89XX | හොන්ඩා | DIO | SGBIQ-56XX | TVS | NTORQ |
| WP BHP-03XX | හොන්ඩා | DIO | WP BIZ-68XX | TVS | NTORQ |
| WP BCY-31XX | හොන්ඩා | DIO | UP BBH-66XX | TVS | METRO |
| WP BGS-83XX | හොන්ඩා | DIO | CP BHN-96XX | TVS | NTORQ |
| WP BIH-72XX | හොන්ඩා | DIO | SG BIS-33XX | TVS | NTORQ |
| SG BGD-83XX | හොන්ඩා | DIO | WP BHJ-70XX | හීරෝ | MAETRO EDGE |
| WP BIR-32XX | හොන්ඩා | DIO | WP YS-05XX | බජාජ් | RE 205 |
| WP BFY-62XX | හොන්ඩා | DIO | WP QA-38XX | බජාජ් | 2stroke |
| WP BFH-40XX | හොන්ඩා | DIO | SG GG-21XX | බජාජ් | 2stroke |
| WP BHV-56XX | හොන්ඩා | DIO SCV 110 | CP QI-30XX | බජාජ් | 2stroke |
| WP BIJ-74XX | හොන්ඩා | DIO SCV 110 | UP YS-05XX | බජාජ් | RE 205 |
| WP BGY-01XX | හොන්ඩා | DIO SCV 110 | WP QP-44XX | බජාජ් | 4stroke |
| WP BGN-50XX | හොන්ඩා | DIO SCV 110 | WP QT-36XX | බජාජ් | 4stroke |
| WP BFD-69XX | හොන්ඩා | DIO SCV 110 | CP QN-56XX | බජාජ් | 4stroke |
| WP BII-60XX | හොන්ඩා | DIO SCV 110 | SG QK-19XX | බජාජ් | 4stroke |
| CP XS-78XX | හොන්ඩා | DIO SCV 110 | WP YL 02XX | බජාජ් | 4stroke |
| WP BGK-04XX | හොන්ඩා | DIO SCV 110 | WP QP-17XX | බජාජ් | 4stroke |
| WP BIH-72XX | හොන්ඩා | DIO SCV 110 | WP YT-76XX | බජාජ් | 4stroke |
| WP BGJ-51XX | හොන්ඩා | DIO SCV 110 | WP QS-24XX | බජාජ් | 4stroke |
| WP BES-84XX | හොන්ඩා | DIO | CP QP-02XX | බජාජ් | 4stroke |
| WP BGX-76XX | හොන්ඩා | DIO SCV 110 | CP QV-91XX | බජාජ් | 4stroke |
| WP BHI-22XX | හොන්ඩා | DIO SCV 110 | CP ABB-97XX | බජාජ් | 4stroke |
| WP BGT-29XX | හොන්ඩා | DIO SCV 110 | CP QX-50XX | බජාජ් | 4stroke |
| WP BDX-21XX | හොන්ඩා | DIO SCV 110 | CP QX-81XX | බජාජ් | 4stroke |
| CP BFL-34XX | හොන්ඩා | DIO SCV 110 | CP QP-40XX | බජාජ් | 4stroke |
| WP BIO-72XX | හොන්ඩා | DIO SCV 110 | UP YB-03XX | බජාජ් | 4stroke |
| WP BDG-92XX | හොන්ඩා | DIO SCV 110 | CP QQ-31XX | බජාජ් | 4stroke |
| SG BIE-44XX | හොන්ඩා | DIO SCV 110 | SG AAO-31XX | බජාජ් | 4stroke |
| WP BIJ-35XX | හොන්ඩා | DIO SCV 110 | SP QM-41XX | බජාජ් | 4stroke |
| CP BID-00XX | හොන්ඩා | DIO SCV 110 | WP QS-97XX | බජාජ් | 4stroke |
| CP BDS-81XX | හොන්ඩා | DIO SCV 110 | WP QE 18XX | බජාජ් | 4stroke |
| WP BIA-94XX | හොන්ඩා | NAVI | CP QL-94XX | බජාජ් | AUTO AR4S |
| WP BIA-95XX | හොන්ඩා | NAVI | WP BFP-42XX | RANO | DREAM 125 |
| WP BIA-96XX | හොන්ඩා | NAVI | WP BIF-88XX | හොන්ඩා | GRAZIA |
| SG BFB-40XX | හොන්ඩා | NAVI | SG-BHK-31XX | හොන්ඩා | Grazia APP8 |
| WP BGM-42XX | යමහා | RAY ZR | SGBIM12XX | හොන්ඩා | GRAZIA |
| WP BFJ-97XX | යමහා | RAY ZR | 13-90XX | හොන්ඩා | CIVIC |
| WP BEZ-68XX | යමහා | RAY ZR | 227-30XX | මැස්ඩා | TITAN |
| WP BEU-80XX | යමහා | RAY ZR | WP BFQ-84XX | හීරෝ | MAESTRO EDGE |
| WP BHZ-99XX | යමහා | FZ | WP HA-75XX | MERCEDES-BENZ | C200KOMORESSOR |
| UP BBB-15XX | යමහා | FZ | UP KD -12XX | සුසුකි | ALTO |
| UP BGB-26XX | යමහා | RAY ZR | WP BIN-17XX | යමහා | STRRET RALLY |
| CP BGA-56XX | යමහා | RAY ZR | WP CAX-21XX | RENULT | KWID |
| SP BGK-66XX | යමහා | RAY ZR | WP CAP-42XX | සුසුකි | WAGON R |
| WP BGA-69XX | යමහා | RAY ZR | WP YX-26XX | PIAGIO | APE |
| SG BIG-50XX | යමහා | RAY ZR | 51-68XX | නිසාන් | CARAVAN |
| | | | WP ZB-17XX | JCB | 3CX |

පරික්ෂාව 2023 ජූලි මස 04 සහ 05 වන දින
(පෙ.ව. 8.30 සිට ප.ව 4.30) දක්වා
අංක. 17/1, පිංහේන හන්දිය, හොරණ පාර, කොට්ටාව.

පෙර දැනුම් දීමකින් තොරව ඕනෑම වාහනයක් ඉවත්කර ගැනීමේ බලය සමාගම සතුය.

වෙන්දේසිය පැවැත්වෙන දිනය
06 - 07 - 2023 (9 .30 පෙ.ව. සිට)

*කොන්දේසි සහිතයි

විශ්ව - 0774787096

Hotline - 0117308080 Whatsapp - 071 0356125

ANA AUCTIONEER
Black Tie Service with True Aloha!
ඒ එන් අල්ගෙවත්ත ඔක්ෂනියර්(ර්)
A N ALGEWATHTHA AUCTIONEER
#333, Janajaya City, Rajagiriya.
+94 71 790 5 790 | info@anaauctioneer.com
www.anaauctioneer.com

AMF
ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
ප්‍රධාන කාර්යාලය
නො.146, හැව්ලොක් පාර, තිඹිරිගස්යාය.
දුරකථන: 0115 553663

එතෙර අරුණ

# මාස අටක් ප්‍රමාද කර අයි.එම්.එෆ්. පාකිස්තාන ණය අනුමත කරයි


අයි.එම්.එෆ්. ප්‍රධානී සහ පාකිස්තාන අගමැති හමුවූ අවස්ථාව

■ රුක්ෂාන් බණ්ඩාර

මෑත ගෙවීයන දශකයේ ලොව ඉතාම සමාන අත්දැකීම්වලට මුහුණදෙන රටවල් දෙකක් වේ නම් ඒ ශ්‍රී ලංකාව සහ පාකිස්තානය විය යුතුය. රටවල් දෙකටම පවතින අර්බුද වසර කිහිපයක සිට අතිශය සමානය. ආර්ථික සහ දේශපාලන ක්ෂේත්‍රයන්හි පාකිස්තානය සහ ශ්‍රී ලංකාව පසුගිය වසර ආරම්භයේ සිට අත්දකින්නේ අදහාගත නොහැකි සමානකමකි. ශ්‍රී ලංකාව ගැන මේ වනවිටත් බොහෝ දේ දන්නා අයට පාකිස්තානය ඊට සමාන වන්නේ කෙසේදැයි සොයා බැලීම මීට දින දෙකකට පෙර වාර්තා වූ ප්‍රවෘත්තියකින්ම ආරම්භ කළ හැකිය.

## දරුණු ආර්ථික අර්බුදයක

පාකිස්තානය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමඟ ඩොලර් බිලියන 03ක ණය මුදලක් ලබාගැනීම සඳහා කාර්ය මණ්ඩල මට්ටමේ එකඟතාවකට පැමිණ ඇත. පාකිස්තානයට මූල්‍ය අරමුදල වෙතින් ලබාදීමට යෝජනා වී ඇති මෙම ණය මුදල ලැබෙන්නේ මාස අටක ප්‍රමාදයකින් පසුවය. 1947දී බ්‍රිතාන්‍යයෙන් නිදහස ලැබීමෙන් පසු පාකිස්තානය නමැති න්‍යෂ්ටික බලයෙන්ද සමන්විත දකුණු ආසියාතික රට එහි දරුණුතම ආර්ථික අර්බුදයට මුහුණ දී සිටී. එම අර්බුදයෙන් ගොඩ ඒමට පාකිස්තානයට අයි.එම්.එෆ්. වෙත යෑම හැර වෙනත් විකල්පයක් ඉතිරි වූයේ නැත. කෙසේ වෙතත් රට තුළ අඛණ්ඩව පවතින දේශපාලන අස්ථාවරභාවය සහ ප්‍රචණ්ඩත්වය නිසා මූල්‍ය අරමුදල සිය ණය පහසුකම ප්‍රමාද කරමින් සිටියේය.

දේශපාලකයන් වසර ගණනාවක් තිස්සේ ආර්ථිකය අවභාවිත කිරීම හේතුවෙන් රටේ මූල්‍ය තත්ත්වය මේ වනවිට බිංදුවටම වැටී ඇත. පසුගිය වසරේ රටට සෘජුවම බලපෑ ගෝලීය බලශක්ති අර්බුදය සහ විනාශකාරී ගංවතුර හේතුවෙන් ආර්ථිකය අගාධයකට තල්ලු කර ඇත. "යුක්රේන - රුසියා යුද්ධය, මිලියන සංඛ්‍යාත පාකිස්තානුවන්ගේ ජීවිතවලට බලපෑ 2022 ව්‍යසනකාරී ගංවතුර සහ ගෝලීයව භාණ්ඩ මිල ඉහළ යාම වැනි බාහිර කම්පන කිහිපයකට ආර්ථිකය මුහුණ දී තිබේ" යැයි පාකිස්තානයේ අයි.එම්.එෆ්. හි දූත මණ්ඩල ප්‍රධානී නේතන් පෝටර් පෙන්වා දෙයි. "මෙම කම්පන මෙන්ම සමහර ප්‍රතිපත්තිමය වැරදි පියවර හේතුවෙන් ආර්ථික වර්ධනය ඇනහිට ඇත" යැයි ඔහු වැඩිදුරටත් සඳහන් කරයි.

## ආණ්ඩුවටත් විපක්ෂයටත් මූල්‍ය විනයක් නැහැ

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක මණ්ඩලය ඉදිරි සතිවලදී ගිවිසුම සලකා බලනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම ගනුදෙනුව පාකිස්තානයට ඉතා දැඩි ලෙස අවශ්‍ය වන ආර්ථික හුස්ම ලබාදෙන්නකි. එහෙත් ප්‍රශ්නය වන්නේ ක්ෂණික සහනවල සිට දිගු කාලීන ප්‍රකෘතියක් කරා පාකිස්තාන ආර්ථිකය ආපසු හැරවීමට අවස්ථාවක් ලෙස මෙම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගනුදෙනුව භාවිතා කළ හැකිද යන්නයි. ඊට හේතුව දැඩි මූල්‍ය විනයකින් රට පවත්වාගෙන යෑමට පාකිස්තානයේ පාලක ෂබාස් ෂරීෆ්ගේ පාර්ශ්වයට මෙන්ම ඉම්රාන් ඛාන්ගේ විපක්ෂයටද දැඩි උවමනාවක් නැති බවට වන අදහසය. මේ දෙපාර්ශ්වයම නිරන්තරයෙන් 'දත මැදගෙන' සිටින්නේ කෙසේ හෝ අනෙකාගෙන් දේශපාලන බලය උදුරා ගැනීම සඳහාය.


පසුගිය වසරේ ආ ගංවතුර

පාකිස්තානයේ උද්ධමන අනුපාතිකය මැයි මාසයේදී 38%කට ආසන්න අතිශය ඉහළ වාර්තාගත මට්ටමක් කරා ළඟා විය. එසේම මිලියන 230කට අධික ජනතාවක් සිටින පාකිස්තානයේ මේ වසරේ විදේශ විනිමය සංචිත සති තුනකට අඩු ආනයන ආවරණය වන මට්ටමට පහත වැටිණි. එහි අදහස වන්නේ රටට භාණ්ඩ ආනයනය කිරීමට පවතින ඩොලර් ප්‍රමාණය ප්‍රමාණවත් වන්නේ සති තුනක් සඳහා පමණක් බවය. හිටපු අගමැති ඉම්රාන් ඛාන්ගේ ආධාරකරුවන් සහ පොලිසිය අතර මාරාන්තික ගැටුම්ද මූල්‍ය වෙළඳපොළවල් අවුල් කර ඇත. පසුගිය මැයි මාසයේදී ඉම්රාන් ඛාන් දූෂණ චෝදනා මත අත්අඩංගුවට ගනු ලැබූ නමුත් ශ්‍රේෂ්ඨාධිකරණය එම අත්අඩංගුවට ගැනීම නීති විරෝධී ලෙසට තීන්දු කරනු ලැබීය.


භාණ්ඩ මිල ඉහළට

## පාකිස්තාන රුපියල 40%කින් පහළට

පසුගිය වසර තුළ පාකිස්තාන රුපියලද එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව 40%කින් පමණ පහත වැටී ඇත. ලොවපුරා සිටින පරිත්‍යාගශීලීන් 2022දී රටට බලපෑ විනාශකාරී ගංවතුරෙන් ගොඩ ඒමට ඩොලර් බිලියන 09කට වඩා ආධාර වශයෙන් ලබාදීමට පොරොන්දු වී ඇත. ගංවතුර ව්‍යසනයෙන් ගොඩ ඒමට ඩොලර් බිලියන 16කට වඩා අවශ්‍ය බව ගණන් බලා තිබිණි. එහෙත් මේ වනතුරුත් එම ආධාර රටට ලැබී නැත. හේතුව පවතින දේශපාලන අස්ථාවරත්වය සහ අන්තවාදී කණ්ඩායම්වල ප්‍රචණ්ඩත්වයයි. එසේම රජය ත්‍රස්තවාදයට දක්වන අනුග්‍රහය මෙන්ම මත්ද්‍රව්‍ය ජාවාරම පාලනය කිරීමට පියවර නොගැනීමද පාකිස්තානයට ආධාර ලබාදෙන රටවල සෘජු අවධානයට ලක්ව තිබේ. අනෙක් අතට පාකිස්තානය කලක් පැවතියේ ඇමරිකාව සහ බටහිර ජාතීන් සමග හිතවත්ව කටයුතු කරන රාජ්‍යයක් ලෙසටය.

එහෙත් ගෙවීගිය වසර 05ක පමණ කාලයේදී දේශපාලකයන් චීනයේ පහසු සහ අධික පොලී ණය වෙත යොමුවෙමින් ආරම්භ කර අතරමග ඇණහිට ඇති යටිතල පහසුකම් ව්‍යාපෘති හේතුවෙන්, චීනය වෙත පාකිස්තානයට ඇති ණය බරද විශාල ලෙස වැඩිවී ඇත. මෙම තත්ත්වය උපයෝගී කරගනිමින් චීනය පාකිස්තානය සිය පාර්ශ්වයට ඇදගැනීමට කටයුතු කරමින් සිටී.

ඊට හොඳම උදහරණය වන්නේ ඩොලර් හිඟ පාකිස්තානයේ ඉන්ධන ආනයනය වෙනුවෙන් රුසියානු බොරතෙල් මිලදී ගැනීමට චීනය සිය යුවාන් භාවිත කිරීමට ඉඩ ලබාදීමයි. මෙමගින් පාකිස්තානය සෘජුවම ඇමරිකාව ඇතුළු බටහිර විරෝධී කඳවුර සමග ඒකාබද්ධ කෙරී ඇත. ඒ අනුව පාකිස්තානයට අයි.එම්.එෆ්. ණය පිළිබඳ එකඟතාවක් ලැබුණද එම වැඩසටහන කෙතරම් දුරකට සාර්ථක කරගැනීමට හැකිවනු ඇද්දැයි යන්න සැක සහිතය. ඒ අයි.එම්.එෆ්. වෙත අරමුදල් සපයන ප්‍රධානම මූලාශ්‍රය නියෝජනය කරනු ලබන්නේ ඇමරිකාව සහ චීන විරෝධී කඳවුරේ සිටින බටහිර රටවල් වීම නිසාය.

---

අරුණ වාණිජ ලෝකය

## ජාතියේ සම්පතක් වන මහජන බැංකුව 62 වැනි සංවත්සරය සමරයි



මෙරට මූල්‍ය ක්ෂේත්‍රයේ මහත් පෙරළියක් ඇති කරමින් ඇරඹි මහජන බැංකුව පිහිටුවා ජූලි මස 01 වැනි දිනට හැට දෙවසරක් සපිරෙයි. එවකට සාමාන්‍ය පොදු ජනතාවට දුරස්ථ වූ බැංකු කටයුතු ඔවුන්ට වඩාත් සමීප අත්දැකීම් වූයේ මහජන බැංකුවේ ආරම්භයත් සමගයි.

ගනුදෙනුකරුවා කේන්ද්‍ර කරගනිමින් ඔවුන්ගේ අවශ්‍යතාවට සරිලන විශාල පරාසයක පැතිරුණු මූල්‍ය සේවා සහ නවීන ඩිජිටල් තාක්ෂණය මුසුවූ සේවාවන් රැසක් හඳුන්වාදෙමින් අද වන විට මහජන බැංකුව රුපියල් ට්‍රිලියන 3කට අධික ඒකාබද්ධ වත්කම් සහිත මෙරට ප්‍රමුඛතම බැංකුවක් බවට පත්ව ඇති අතර, දේශයේ අභිමානය ලෙස මෙරට සමාජ, ආර්ථික පුනරුදයට අඛණ්ඩව දයකත්වය සැපයීම සුවිශේෂ කරුණකි.

ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය, ග්‍රාමීය බැංකු ක්‍රමය හා ගැමි ජනතාව නගාසිටුවීම අරමුණු කරගනිමින් 1961 අංක 29 දරන පනත යටතේ මහජන බැංකුව පිහිටුවන ලදී. එම පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ එවකට පැවැති ගරු සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිතුමියගේ රජයේ වෙළෙඳ, ආහාර සමුපකාර හා නාවික කටයුතු අමාත්‍යවරයා වූ ගරු ටී.බී. ඉලංගරත්න ශ්‍රීමතාණන්ය. මහජන බැංකුවේ ප්‍රථම සභාපතිවරයා වූයේ එවකට සමුපකාර ක්ෂේත්‍රයේ විසල් මෙහෙයක් සිදුකරමින් සිටි වින්සන්ට් සුබසිංහ මහතාය.


සුජීව රාජපක්ෂ සභාපති


ක්ලයිව් ෆොන්සේකා වැඩබලන ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී

ඉංග්‍රීසි, උගත් ඇති හැකි පැළැන්තියට පමණක් සීමාවී තිබුණු බැංකු ක්‍රමයේ සීමා වළලු දෙදරා යෑමට මුල පිරුණේ මහජන බැංකුවේ ආරම්භයයි. එහි ප්‍රතිඵලයක් ලෙස සිංහල හා දෙමළ භාෂාවෙන් වැඩ කිරීම ආරම්භ කළ ප්‍රථම බැංකුව බවට පත්වීමට මහජන බැංකුවට හැකිවිය.

සාමාන්‍ය ජනතාව ඉතුරුම් සඳහා දිරිමත් කිරීමටද, ඒ සමගම රන් භාණ්ඩ උකස් සේවා කටයුතුවලටද මහජන බැංකුව 1963 දී අවතීර්ණ විය. රාජ්‍ය බැංකුවක ආරක්ෂාව සහිත සාධාරණ පොලී අනුපාත අනුව රන් භාණ්ඩ උකස් සේවාව ක්‍රියාත්මක වීම නිසා එතෙක් අවිධිමත් ව තිබූ රන්භාණ්ඩ උකස් වෙළෙඳපොළ විධිමත් විය.

මේ වන විට දිවයින පුරා පිහිටා ඇති මහජන බැංකු ශාඛා සංඛ්‍යාව 745ක් වන අතර, 7300කට අධික කාර්ය මණ්ඩලයකින් සමන්විතය. එමෙන්ම 280කට අධික පමණ වන මහජන බැංකුවේ ස්වයං බැංකුකරණ ඒකකයන් (SBU) තුළින් වසරේ සතියේ ඕනෑම දිනයක පැය 24 පුරාම බැංකු ශාඛාවට නොගොසින්ම වඩාත් පහසු සහ කාර්යක්ෂම බැංකු අත්දැකීම් ලබාගැනීමේ අවස්ථාව සලසා ඇත. සමස්ත ගනුදෙනුකාර ප්‍රජාව මිලියන 14.7 කට අධික වන අතර, එය මෙරට වාණිජ බැංකුවක් වටා එක්ව සිටින විශාලතම ගනුදෙනුකාර සංඛ්‍යාව වීම විශේෂත්වයකි.

විවිධ වයස් කාණ්ඩවලට හා විවිධ ක්ෂේත්‍රයන්හි නියැළෙන ගනුදෙනුකාර භවතුන්ට ගැළපෙන පරිදි සන්නම් නාම ගතකරන ගිණුම් හඳුන්වාදීමට මහජන බැංකුව පියවර ගෙන තිබේ. විවිධ ණය යෝජනා ක්‍රම දියත් කරමින් තම ගනුදෙනුකරුවන් වෙත උසස් ජීවන තත්ත්වයක් ලබාදීමට මෙන්ම ව්‍යාපාර සංවර්ධනය සඳහා අවශ්‍ය දිරිය ලබාදීමටද මහජන බැංකුව ක්‍රියාකරයි.

වගකිය යුතු රාජ්‍ය බැංකුවක් ලෙස මහජන බැංකුව ගනුදෙනුකරුවන්ට මූල්‍ය පහසුකම් ලබාදීමෙන්ම නොනැවතී මෙරට සමාජ ආර්ථික ප්‍රගතිය උදෙසා ද සිදුකර ඇති මෙහෙවරද සුළු පටු නොවේ. රාජ්‍ය බැංකුවක් ලෙස මහජන බැංකුව පසුගිය හැට වසර පුරාවටම අපනයන, අධ්‍යාපන, සෞඛ්‍ය, අධිවේගී, මාර්ග, සංචාරක, යටිතල පහසුකම් ආදි ක්ෂේත්‍රයන් සඳහා මූල්‍ය පහසුකම් ලබාදෙමින් රටේ ආර්ථික සංවර්ධනයට දැක්වූ දයකත්වයද සුවිශාලය.

ලෝකයේ පුරා විසිරී ඇති බැංකු 900 කට අධික සංඛ්‍යාවක් සමග සාර්ථකව ගනුදෙනු කරන මහජන බැංකුව, පුද්ගලික හා රාජ්‍ය හිමිකාරීත්වය සහිත සමාගම්වලට ණයවර ලිපි හා ඇපකර නිකුත් කරමින් රටේ ආනයන හා අපනයන කටයුතු සඳහා විශාල දයකත්වයක් පිරිනමයි. විශේෂයෙන් රටට අත්‍යවශ්‍ය ද්‍රව්‍යවන ඉන්ධන, ඖෂධ, ගෑස් වැනි දෑ ගෙන්වීමේදී මහජන බැංකුව ඒ සඳහා අවශ්‍ය ණයවර ලිපි නිකුත් කරමින් මෙරට ජන ජීවිතය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාමට අවශ්‍ය මූල්‍ය සේවා සපයයි.

එමෙන්ම මහජන බැංකුව, නව ලොවට ගැළපෙන පරිදි සිය ගනුදෙනුකාරභවතුන්ට වඩාත් පහසු ආරක්ෂිත හා කාර්යක්ෂම බැංකු පහසුකම් සමීප කිරීමේ අරමුණින් 2015 වසරේදී ඩිජිටල් බැංකුකරණ ව්‍යාපෘතිය දියත් කරන ලදී.

මෙම ඩිජිටල් පරිවර්තන ක්‍රියාවලිය තුළින් People's Wiz ඩිජිටල් ගිණුම් විවෘත කිරීමේ පහසුකම, People's Wave ජංගම දුරකතන යෙදවුම, People's Wiz Credit ඩිජිටල් ණය උත්පාදන පද්ධතිය, People's Wyn ආයතනික ජංගම දුරකථන යෙදවුම, People's Web අන්තර්ජාල බැංකු පහසුකම හා People's Pay Digital Wallet App යෙදවුම හඳුන්වා දෙන ලදී.

## ලංකා බැංකුවේ දඹුල්ල රාත්‍රි බැංකු ඒකකය නවීකරණය වේ



වඩාත් පහසු, නම්‍යශීලී සහ කාර්යක්ෂම බැංකු සේවාවක් සැපයීමේ අරමුණින් දඹුල්ල විශේෂ ආර්ථික මධ්‍යස්ථාන පරිශ්‍රයේ පිහිටි නවීන ඩිජිටල් තාක්ෂණය හා මුසුවූ නවීකරණය කරන ලද ලංකා බැංකුවේ දඹුල්ල රාත්‍රි බැංකු ඒකකය පසුගියද සුබ මොහොතින් විවෘත කරන ලදී. ඒ වෙනුවෙන් සංවිධානය කළ උත්සවයට ලංකා බැංකුවේ නියෝජ්‍ය මහා කළමනාකරු (ශාඛා මෙහෙයුම්) ප්‍රියල් සිල්වා, මධ්‍යම පළාත් සහාකර මහා කළමනාකරු සරත් විජේසිංහ. පාරිභෝගික සහ සංවර්ධන බැංකු කටයුතු අංශයේ සහකාර මහා කළමනාකරු සමන්ත විමලසිරි, අලෙවි අංශයේ සහකාර මහා කළමනාකරු බුද්ධික ප්‍රේමරත්න, මධ්‍යම පළාත් මෙහෙයුම් කළමනාකරු එච්.ඒ. කුමාර සම්පත්, මාතලේ ප්‍රාදේශීය කළමනාකරු චන්දන දිසානායක සහ දඹුල්ල ශාඛා කළමනාකරු උදර විශ්වජිත් යන මහත්වරු ඇතුළු ආරාධිත අමුත්තෝ රැසක් සහභාගි වූහ.

විශේෂ ආර්ථික මධ්‍යස්ථානය ඇතුළුව දඹුල්ල ප්‍රදේශය ආශ්‍රිතව ජීවත්වන ජනතාව සමාජයීය හා ආර්ථික වශයෙන් බලගැන්වීම සහ ඔවුන් වෙත මූල්‍ය පහසුකම් සමගින් ප්‍රධාන බැංකු සේවාවන් රැසක් ලබාදීම ලංකා බැංකුවේ දඹුල්ල රාත්‍රි බැංකු ඒකකයේ අරමුණ වන අතර, එමගින් බැංකු සේවාවන් රැසක් ලබාගැනීමේ හැකියාව ගනුදෙනුකරුවන් වෙත සැලසේ.

## Riyelta යතුරුපැදි සහ ත්‍රිරෝද රථ බැටරි දැන් සිංගර් අලෙවිසල්වලින්




ශ්‍රී ලංකාවේ පාරිභෝගික භාණ්ඩ අලෙවිකරණයේ ප්‍රමුඛතම සන්නාමයක් වන සිංගර් ශ්‍රී ලංකා පීඑල්සී Riyelta බැටරි නිෂ්පාදනයන් මෙරට තුළ බෙදාහැරීමේ නිල බෙදාහරින්නා වශයෙන් ලීඩර් සමූහ ව්‍යාපාරය සමග හවුල්කාරිත්වයට එළැඹීම පසුගියද සිදුවිය. එසේම Riyelta සන්නාමය යටතේ මෑතකදී එළිදක්වන ලද බැටරි නිෂ්පාදන පෙළ යතුරුපැදි මෙන්ම ත්‍රිරෝද රථ සඳහා උචිත අයුරින් නිර්මාණය කර ඇත.

උසස් තත්ත්වයේ යුරෝපියානු බැටරි භාවිතයේ අත්දැකීම මෙරට පාරිභෝගිකයන් වෙත ලබාදෙමින් ජර්මානු තාක්ෂණය යොදගෙන මෙම බැටරි ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබයි. Riyelta බැටරි යතුරුපැදි හා ත්‍රිරෝද රථ හිමියන්ට දැරිය හැකි පහසු මිල ගණන් යටතේ වෙළෙඳපොළට නිකුත් කරන අතර නුදුරේදී මෝටර් රථ පාරිභෝගිකයන් වෙනුවෙන් ද මෙම අවස්ථාව ලබාදීමට නියමිතය.

## SLT-MOBITEL ඇගයීමට ලක් වේ




ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විසඳුම් සම්පාදක වන SLT-MOBITEL, 2022 UiPath Automation Excellence සම්මාන උළෙලේදී 'ශ්‍රී ලංකාවේ ස්වයංක්‍රීයකරණ විශිෂ්ටත්වය' යන කාණ්ඩය යටතේ ජූරියේ ඇගයීමට ලක් විය. SLT-MOBITEL UiPath සම්මාන උළෙලකදී ඇගයීමට ලක්වූ දෙවැනි අවස්ථාව මෙයයි.

හතරවැනි වරටත් පැවැති UiPath Automation Excellence සම්මාන උළෙල Economic Times සමග හවුල්කාරීත්වයෙන් යුතුව අතථ්‍ය (Virtual) ක්‍රමයට පවත්වන ලදී. ඉන්දියාවේ සහ දකුණු ආසියානු කලාපයේ පරිවර්තනීය ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘති ඔස්සේ මෙහෙයුම් විශිෂ්ටත්වය ළඟා කරගත් පුද්ගලයන් සහ ආයතන ඇගයීමට ලක්කිරීම මෙම සම්මාන උළෙලේ අරමුණ විය.

UiPath RPA (Robotic Process Automation) මෙවලම භාවිත කරමින් තම ව්‍යාපාර හා මෙහෙයුම් කටයුතුවල විවිධ අංශ ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා SLT-MOBITEL විසින් පසුගිය කාලය තුළ වැඩසටහන් රැසක් ක්‍රියාවට නංවන ලදී. ඒ අතරින් ණය පාලනය සහ ආදයම් තහවුරුකරණය යන අංශවලට අදළව ක්‍රියාවට නංවන ලද ස්වයංක්‍රීයකරණ වැඩසටහන් මෙම වසරේ සම්මාන උළෙලේදී ඇගයීමට ලක්විය.

## කුරුණෑගල දිස්ත්‍රික් ලොතරැයි අලෙවි නියෝජිත හමුවක්




■ පුෂ්පකුමාර ජයරත්න - කුරුණෑගල
■ අනුර ජයන්ත දිසානායක - මල්ලවපිටිය

අලෙවි කරන සියලුම ලොතරැයි ටිකට් පත්වල මිල රුපියල් විස්සේ සිට හතළිහ දක්වා ඉහළ නැංවීමටගෙන ඇති තීරණය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට කුරුණෑගල දිස්ත්‍රික්කයේ සියලුම ලොතරැයි අලෙවි නියෝජිතයන්ගේ සුබසාධක සංගමයේ සාමාජිකයන් පසුගියද කුරුණෑගල නුවර පාරේ පිහිටි රදගුරු මැදුරේ රැස්වීම් ශාලාවට එක්වූහ.

මෙහිදී ලොතරැයි මිල ඉහළ දැමීම සම්බන්ධයෙන් කිසිදු විරෝධතාවක් නොදක්වා ඒ සඳහා පූර්ණ සහාය පළ කිරීමට තම සංගමයේ සියලුම සාමාජිකයන් එකඟතාව පළ කළ බව එම සංගමයේ සභාපති නිහාල් රත්නමලල මහතා ප්‍රකාශ කළේය.

ලොතරැයි මිල ඉහළ දැමීමෙන් අනතුරුව ඇති විය හැකි අලෙවි ගැටලුවලට මුහුණ දීම සඳහාත් ලොතරැයි අලෙවි ප්‍රවර්ධන කටයුතු සම්බන්ධයෙන්ද මෙහිදී සාකච්ඡා කළ බව ජාතික ලොතරැයි මණ්ඩලයේ කුරුණෑගල දිස්ත්‍රික් භාර නිලධාරී අමිත් උදයංග මහතා පැවසීය. මේ හමුවට කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරන ලොතරැයි අලෙවි නියෝජිතවරුන් සීයකට ආසන්න පිරිසක් සහභාගි වූහ.

## ඩිජිටල් පහසුකම් සමානව ලබා දීමට සැලැස්මක්



දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකට ම ඩිජිටල් පහසුකම් සමාන ආකාරයෙන් බෙදී යාම සහ විෂමතාවන් අවමකර ගනිමින් එලදයී ඩිජිටල් සංවර්තනයක් ඇති කිරීමට අවශ්‍ය උපාය මාර්ග හඳුන්වා දීමට ස්ථාපිත කරන ලද දිස්ත්‍රික් ඩිජිටල් සංවර්තන කමිටු (District Digital Transformation Committee) සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සැකසේ.

දිස්ත්‍රික් ඩිජිටල් සංවර්තන කමිටු මේ වන විට දිවයිනේ දිස්ත්‍රික්ක 21ක ස්ථාපිත කර අවසන් අතර දිස්ත්‍රික්කයේ ඩිජිටල් සංවර්තනය සම්බන්ධයෙන් බලපාන ගැටලු හඳුනාගෙන ඒ සඳහා උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම මෙම කමිටුව මගින් සිදු කෙරේ. කෑගල්ල දිස්ත්‍රික් ඩිජිටල් සංවර්තන කමිටුව සඳහා මෙම ප්‍රථම ක්‍රියාකාරී සැලැස්ම සැකසීම තාක්ෂණ රාජ්‍ය අමාත්‍ය කනක හේරත් මහතාගේ ප්‍රධානත්වයෙන් කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේදී සිදු කෙරිණි.

දිස්ත්‍රික් ලේකම්වරයා සහ ප්‍රාදේශීය ලේකම්වරුන් සමග සාමාජිකයන් තිස් දෙනකුගෙන් මෙම ක්‍රියාකාරී කමිටුව සමන්විත වන අතර උසස් අධ්‍යාපන ආයතන, වෘත්තීය පුහුණු ආයතන, ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය, අපනයන සංවර්ධන මණ්ඩලය, ජාතික තරුණ සේවා සභාව ඇතුළු ආයතනවල නියෝජිතයන් මෙන් ම තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් හා නිදහස් තොරතුරු තාක්ෂණවේදීන් ඒ අතර වෙයි.

## මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ (ජනරජය) සුදුසුකම් ලත් හිමිකරුවන් වෙත නිවේදනය (I) ශ්‍රී ලංකා ජනරජයේ ශ්‍රී ලංකා රුපියල් භාණ්ඩාගාර බැඳුම්කර ජනරජයේ නව ශ්‍රී ලංකා රුපියල් භාණ්ඩාගාර බැඳුම්කර සඳහා හුවමාරු කර ගැනීමට ආරාධනාවක් සහ (II) ජනරජයේ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (ඇමරිකා එක්සත් ජනපද ඩොලර්), ජනරජයේ නව ශ්‍රී ලංකා රුපියල් භාණ්ඩාගාර බැඳුම්කර සහ/හෝ නව ඇමරිකා එක්සත් ජනපද ඩොලර් භාණ්ඩාගාර බැඳුම්කර සඳහා හුවමාරු කර ගැනීම නිවේදනය කිරීම.**

ජනරජයේ දේශීය ණය ප්‍රශස්ත කිරීමේ වැඩසටහනේ කොටසක් ලෙස 2023 ජූලි 1 දිනැති ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ යෝජනාවකට අනුව, පහත සඳහන් ආරාධනා දියත් කර ඇති බව ජනරජය අද නිවේදනය කරයි.

**සෑම අවස්ථාවකදීම අදාළ නීතිවලට අනුකූලව.**

ජනරජය විසින් නිකුත් කරනු ලබන නව භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ජනරජය විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරු කිරීම සඳහා පිරිනැමීම් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලත් හිමිකරුවන් වෙත ආරාධනා කිරීම (භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරු යෝජනාව); සහ

ජනරජය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර, ජනරජය විසින් නිකුත් කිරීමට නියමිත නව ශ්‍රී ලංකා රුපියල් භාණ්ඩාගාර බැඳුම්කර සහ/හෝ ඇමරිකා එක්සත් ජනපද ඩොලර් භාණ්ඩාගාර බැඳුම්කර සඳහා හුවමාරු කර ගැනීම සඳහා පිරිනැමීම් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලත් හිමිකරුවන් වෙත ආරාධනා කිරීම (ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හුවමාරු යෝජනාව).

### භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරු යෝජනාව

**භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරු යෝජනාවේ නියමයන් (සහභාගී වීමට සුදුසුකම් ලබන්නේ කවුරුන්ද යන්න පිළිබඳ විස්තර, භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරුවට යටත් වන භාණ්ඩාගාර බැඳුම්කර, භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරු කිරීමේ නියමයන් සහ කොන්දේසි සහ නව භාණ්ඩාගාර බැඳුම්කරවල මූල්‍ය නියමයන් සහ අයදුම්පතක් ඉදිරිපත් කිරීම සඳහා උපදෙස් ඇතුළුව) 2023 ජූලි 4 දිනැති භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරු පත්‍රිකාවක දක්වා ඇත. භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරු පත්‍රිකාව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.** (www.treasury.gov.lk/web/ddo).

### ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හුවමාරු යෝජනාව

**ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හුවමාරු යෝජනාවේ නියමයන් (සහභාගී වීමට සුදුසුකම් ලබන්නේ කවුරුන්ද යන්න පිළිබඳ විස්තර, හුවමාරුව සඳහා යටත් වන ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර, එක්සත් ජනපද ඩොලර් සහ/හෝ ශ්‍රී ලංකා රුපියල් වලින් නම් කරන ලද නව භාණ්ඩාගාර බැඳුම්කරවල හුවමාරු ක්‍රියාපටිපාටිය සහ මූල්‍ය නියමයන් ඇතුළු නියමයන් සහ කොන්දේසි සහ අයදුම්පතක් ඉදිරිපත් කිරීම සඳහා උපදෙස් ඇතුළුව) 2023 ජූලි 4 දිනැති ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හුවමාරු පත්‍රිකාවක දක්වා ඇත. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හුවමාරු පත්‍රිකාව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.** (www.treasury.gov.lk/web/ddo).

### සිදුවීම්වල අපේක්ෂිත කාල රාමුව

| දිනය | ක්‍රියාව |
|---|---|
| 2023 ජූලි 4 | *දියත් කිරීමේ දිනය* |
| 2023 ජූලි 4 සිට 2023 ජූලි 25 දක්වා | *ආරාධනා කාලය (දිගු කළහොත් හෝ කලින් අවසන් නොකළහොත්)* |
| 2023 ජූලි 7 පෙ.ව. 10:00 (ඉන්දියානු සම්මත වේලාවෙන්) | *සුදුසුකම් ලත් බැඳුම්කර හිමියන් දැනුවත් කිරීම (පහත බලන්න)* |
| 2023 ජූලි 25 ප.ව. 4:00 (ඉන්දියානු සම්මත වේලාවෙන්) | *පිරිනැමීම් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලත් බැඳුම්කර හිමිකරුවන් සඳහා අවසාන දිනය.* |
| 2023 ජූලි 28 හෝ ඊට ආසන්න | *ජනරජය විසින් පිරිනැමීම් පිළිගැනීම පිළිබඳ නිවේදනය මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ/දේශීය පුවත්පත්වල පළ කරනු ලැබේ* |
| 2023 ජූලි 31 | *නව භාණ්ඩාගාර බැඳුම්කර පියවීමේ දිනය* |

### සුදුසුකම් ලත් බැඳුම්කර හිමියන් දැනුවත් කිරීම

**2023 ජූලි 7 පෙ.ව. 10:00** ට භාණ්ඩාගාර බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වල හිමිකරුවන්ට පමණක් මාර්ගගත ඉදිරිපත් කිරීමක් සිදු කිරීමට (virtual presentation) ජනරජය අදහස් කරයි.

ඉදිරිපත් කිරීම සඳහා සහභාගී වීමට ඔබට: https://www.treasury.gov.lk/web/ddo හි ලියාපදිංචි විය හැක. මාධ්‍යවේදීන්ට මේ සඳහා සහභාගී වීමට අවසර නොදේ.

### මුක්තකරණය

මෙම නිවේදනයේ හුවමාරු යෝජනා වල නියමයන් සහ කොන්දේසි සම්පූර්ණයෙන්ම අඩංගු නොවන අතර හුවමාරු යෝජනා වල කොටසක් ලෙස සැලකිය නොහැකිය. හුවමාරු යෝජනා වල නියමයන් සහ කොන්දේසි භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරු පත්‍රිකාවේ සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හුවමාරු පත්‍රිකාවේ අඩංගු වන අතර, ඒ සෑම එකක්ම එහි දක්වා ඇති පිරිනැමීම සහ බෙදා හැරීමේ සීමාවන්ට යටත් වේ.

**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

**2023 ජූලි 04**

## මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

### ශ්‍රී ලංකාවේ දේශීය රාජ්‍ය ණය පිළිබඳ ප්‍රතිපත්ති නිවේදනය

1. 2023 ජූලි 01 දින යෝජනාවක් මගින් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ දේශීය රාජ්‍ය ණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ (රජයේ) ප්‍රතිපත්තිය අනුමත කරන ලදී.

2. ඉහළ උද්ධමනය, ක්ෂය වූ ජාත්‍යන්තර සංචිත, තිරසාර නොවන රාජ්‍ය ණය සහ ඉහළ ගිය මූල්‍ය අංශයේ අවදානම් මධ්‍යයේ ශ්‍රී ලංකාව දැඩි අවපාතයකට මුහුණ දෙමින් දැවැන්ත ආර්ථික, මානුෂීය සහ සමාජීය අභියෝගවලට මුහුණ දී සිටී. ඒ අනුව, සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ රාජ්‍ය ණය තිරසාරභාවය ප්‍රතිෂ්ඨාපනය කිරීම, මූල්‍ය ස්ථාවරත්වය ආරක්ෂා කිරීම සහ ශ්‍රී ලංකාවේ වර්ධන විභවයන් විවෘත කිරීම සඳහා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ වේගවත් කිරීමේ අරමුණින්, රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමඟ 2023 මාර්තු 20 වැනි දින ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක මණ්ඩලය විසින් අනුමත කරන ලද SDR බිලියන 2.286 ක (එක්සත් ජනපද ඩොලර් බිලියන 3.0 ක පමණ) විස්තීර්ණ අරමුදල් පහසුකම (EFF) යටතේ මාස 48 ක වැඩපිළිවෙළකට එළඹුණි.

3. දේශීය ණය ප්‍රශස්තකරණය (DDO) විස්තීර්ණ ණය පහසුකමට අනුකූලව සිදුකරනු ලබන කාර්යයක් වන අතර, එය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එකඟ වී ඇති ණය තිරසාර භාවය මගින් ඉලක්ක සපුරාගැනීමට උපකාරී වේ. මෙම ඉලක්ක වල අභිලාෂකාමී ස්වරූපය, අනාගතයේදී ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය ප්‍රති නිකුතුව තුළින් පියවීමේ අවධානම පාලනය කිරීමේ අවශ්‍යතාවය හා ශ්‍රී ලංකාවේ ණය ප්‍රශ්ණය විසඳීමේදී සියළුම ණය හිමියන්ගේ සාධාරණ දායකත්වයක් තහවුරු කිරීම මෙන්ම දේශීය මූල්‍ය පද්ධතිය අනතුරකට පත්කිරීමකින් තොරව මෙය සිදුකිරීමට ඇති අවශ්‍යතාවය තුළින් මෙය සාධාරණීකරණය කරනු ලබයි.

4. ශ්‍රී ලංකාවේ ණය උපදේශකයන්ගේ සහාය ඇතිව, ශ්‍රී ලංකාවේ දේශීය රාජ්‍ය ණය සංයුතිය, එහි නියමයන් සහ කොන්දේසි, ආයෝජකයන්ගේ සාන්ද්‍රණය, ගිණුම්කරණ ප්‍රතිකාර සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට එවැනි දේශීය ණය ප්‍රශස්තකරණය මගින් ඇති විය හැකි බලපෑම ඇතුළුව ශ්‍රී ලංකාවේ දේශීය රාජ්‍ය ණය පිළිබඳ සියුම් විශ්ලේෂණයකින් පසුව, දේශීය ණය ප්‍රශස්තකරණයට ඇතුළත් අංග සාරාංශයක් ලෙස පහත දැක්වේ.

(අ) 2023 ඔක්තෝබර් 01 වැනිදා සිට යෙදිය හැකි එවැනි අධි විශ්‍රාමික අරමුදල්වල, භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනවලින් ආරෝපණය කළ හැකි, බදු අය කළ හැකි ආදායම මත සියයට 30ක් දක්වා බදු අනුපාතයක් අය නොකිරීම සඳහා, භාණ්ඩාගාර බැඳුම්කරවල ඇතැම් සුදුසුකම් ලත් හිමිකරුවන්ට විශේෂයෙන් 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත ( සංශෝධිත පරිදි) යටතේ අදහස් වන සේවක අර්ථසාධක අරමුදලක්, අනුමත අර්ථසාධක අරමුදලක්, විශ්‍රාම අරමුදලක් හෝ අනුමත සේවය අවසන් කිරීමේ අරමුදලක් (විශාල අරමුදලක්), යෝජිත පරිවර්තනය හෝ හුවමාරුව ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමේ දිනට පෙර ව්‍යාපාරික දිනදී පැවති, 2024 හා 2032 අතර (වර්ෂ දෙකම ඇතුළුව) පරිණත වන භාණ්ඩාගාර බැඳුම්කර වල මුළු වටිනාකමින් 100% හා 2023 දී පරිණත වන භාණ්ඩාගාර බැඳුම්කර වල මුළු වටිනාකමින් 50% කට නොඅඩු ප්‍රමාණයක් ගැලපීම සඳහා, 1937 අංක 7 දරන (සංශෝධිත පරිදි) ලියාපදිංචි කළ කොටස් හා සුරැකුම්පත් ආඥාපනත යටතේ නිකුත් කර ඇති භාණ්ඩාගාර බැඳුම්කර, එම ලියාපදිංචි කොටස් සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ නිකුත් කරනු ලබන නව භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කිරීම/හුවමාරු කිරීම. කෙසේ වෙතත්, 2023 ජූලි 15 දින කල් පිරෙන භාණ්ඩාගාර බැඳුම්කර ඉහත පරිමිතියෙන් බැහැර කරනු ලැබේ.

(ආ) 1923 අංක 8 දරන (සංශෝධිත පරිදි) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නිකුත් කර ඇති භාණ්ඩාගාර බිල්පත් 1937 අංක 7 දරන ලියාපදිංචි කොටස් හා සුරැකුම්පත් ආඥාපනත (සංශෝධිත පරිදි) යටතේ නිකුත් කිරීමට නියමිත භාණ්ඩාගාර බැඳුම්කර බවට පත් කිරීම.

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජයට ලබා දෙන තාවකාලික අත්තිකාරම් එකී ලියාපදිංචි කොටස් හා සුරැකුම්පත් ආඥාපනත (සංශෝධිත පරිදි) යටතේ නිකුත් කිරීමට නියමිත භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කිරීම.

(ඈ) 1957 අංක 29 දරන විදේශ ණය පනත යටතේ නිකුත් කරන ලද ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර 1937 අංක 7 දරන (සංශෝධිත පරිදි) ලියාපදිංචි කොටස් සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ නිකුත් කිරීමට නියමිත ශ්‍රී ලංකා රුපියල් සහ/හෝ ඇමරිකා එක්සත් ජනපද ඩොලර් භාණ්ඩාගාර බැඳුම්කර වෙත හුවමාරු කිරීම.

(ඉ) රජයේ දේශීය නීතිය යටතේ නිකුත් කරන ලද විදේශ විනිමය බැංකු ණය ප්‍රතිව්‍යුහගත කිරීම.

5. භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන හුවමාරු යෝජනාවට අදාළව ගැටලු ddo.tbonds@cbsl.lk සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා වන හුවමාරු යෝජනාවට අදාළව ගැටලු ddo.sldb@cbsl.lk යන ලිපිනයෙන් රාජ්‍ය ණය අධිකාරී වෙත විද්‍යුත් තැපැලෙන් යොමු කළ හැකිය. පොදු අදාළත්වයක් ඇති එවැනි ගැටලු සඳහා ඕනෑම ප්‍රතිචාරයක් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ (www.treasury.gov.lk//web/ddo) වෙබ් අඩවියේ වහාම පළ කරනු ලැබේ.

**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

2023 ජූලි 04